සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ
සීමිත / විවෘත තරග විභාගය - 2016 (2018)

(01) මූල්‍ය ගණකාධිකරණය - I වන පත්‍රය

පැ තුනයි

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

1. සීමිත කොළඹ පොදු සමාගමේ පොත්වල 2017 මාර්තු 31 දිනට සඳහන් ගිණුම් ශේෂ මෙසේය.

| | හර (රු.) | | බැර (රු.) |
|---|---|---|---|
| ඉඩම් - පිරිවැයට | 250 000 | ආයෝජන ආදායම් | 12 000 |
| ගොඩනැගිලි - පිරිවැයට | 100 000 | බොල්ණය වෙන් කිරීම, 2016.04.01 දිනට | 2 000 |
| ලී බඩු - පිරිවැයට | 30 000 | ණයහිමියෝ | 30 000 |
| ණයගැතියෝ | 50 000 | ක්ෂය වෙන් කිරීම 2016.04.01 | |
| තොගය, 2017.03.31 දිනට | 40 000 | – ගොඩනැගිලි | 5 000 |
| බැංකුවේ ඇති මුදල් | 15 000 | – ලී බඩු | 5 000 |
| අතැති මුදල් | 1 000 | සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 370 000 |
| විකුණුම් පිරිවැය | 300 000 | 10% සමුච්චිත වරණීය කොටස් ප්‍රාග්ධනය | 80 000 |
| වේතන | 15 000 | සංචිත | 20 000 |
| විවිධ වියදම් | 8 000 | බැංකු අයිරාව | 100 000 |
| කොටස්වල ආයෝජන | 200 000 | විකුණුම් | 400 000 |
| පොලී වියදම් | 3 000 | රඳවා ගත් ලාභ, 2016.04.01 දිනට | 6 500 |
| බොල් ණය | 1 000 | | |
| අලුත්වැඩියා හා නඩත්තු වියදම් | 1 500 | | |
| ආදායම් බදු සඳහා අත්තිකාරම් ගෙවීම | 16 000 | | |
| | **1 030 500** | | **1 030 500** |

අතිරේක තොරතුරු :

(i) 2017 ජනවාරි 01 දින සුදුසුකම් ලත් තක්සේරුකරුවකු ලවා ඉඩම් රු. 350 000 කට තක්සේරු කළ අතර අධ්‍යක්ෂවරුන් විසින් එම තක්සේරු අගය ගැළපීමට තීරණය කළ ද මෙතෙක් එය පොත්වල හඳුනාගෙන නැත.

(ii) බොල්ණය වෙන් කිරීම ණයගැතියන්ගෙන් 5% සේ ගැළපිය යුතු වේ.

(iii) ආදායම් බදු වෙන් කිරීම ලාභයෙන් 30% ක් විය යුතු වේ.

(iv) 2017 මාර්තු 31 දිනට ආයෝජනවල වෙළඳපළ අගය රු. 185 000 කි.

(v) ආයතනයේ අධ්‍යක්ෂවරු බදු පෙර ලාභයෙන් 5% කට සමාන ප්‍රසාද දීමනාවකට හිමිකම් ලබති.

(vi) ක්ෂයවීම්, හීනවන ශේෂ ක්‍රමයට අනුව වර්ෂයකට, ගොඩනැගිලි සඳහා 2% ද ලී බඩු සඳහා 10% ද ලෙස ගණනය කරනු ලබයි.

(vii) 2016 මාර්තු 31 දින දක්වා සමුච්චිත වරණීය කොටස් සඳහා වසර 05 ක ලාභාංශ ගෙවිය යුතුව ඇත.

(viii) ලැබිය යුතු බිල්පත් රු. 6 500 ක් වට්ටම් කරගෙන ඇති අතර ඒවායේ කල්පිරෙන දිනය 2017 මාර්තු 31 දිනට පසුව වේ.

අවශ්‍ය වන්නේ:

LKAS 1 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතියට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත කොළඹ පොදු සමාගමේ පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන, (සටහන් ද ඇතුළත්ව)

(1) 2017 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

(2) 2017 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය

(3) 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

(ලකුණු 25 යි)

[ 2 වැනි පිටුව බලන්න.

**2.** හලාවත ට්‍රේඩර්ස්හි ආදායම් ප්‍රකාශනය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පහත දී ඇත.

ආදායම් ප්‍රකාශනය

**2017 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා**

| | රු. '000 | රු. '000 |
|---|---|---|
| විකුණුම් | | 300 000 |
| අඩුකළා විකුණුම් පිරිවැය | | (258 000) |
| දළ ලාභය | | 42 000 |
| මෙහෙයුම් වියදම් | | |
| – විකිණීමේ හා බෙදාහැරීමේ | 2 200 | |
| – පොදු පරිපාලන | 4 000 | |
| – කාර්යාල කුලිය | 2 800 | (9 000) |
| දළ මෙහෙයුම් ලාභය | | 33 000 |
| ක්ෂය වීම් | | (10 000) |
| | | 23 000 |
| වෙනත් ආදායම් | | |
| ආණ්ඩුවේ සුරැකුම් මත පොලී ආදායම | | 1 500 |
| | | 24 500 |
| මූල්‍ය පිරිවැය | | |
| – බැංකු අයිරා පොලී | 300 | |
| – ණය පොලී | 4 200 | (4 500) |
| බදු පෙර ශුද්ධ ආදායම | | 20 000 |
| ආදායම් බද්ද 30% | | (6 000) |
| බදු පසු ශුද්ධ ආදායම | | **14 000** |

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

**2017 මාර්තු 31 දිනට**

| | (රු. '000) | | | (රු. '000) |
|---|---|---|---|---|
| ණයහිමියෝ | 6 000 | මුදල් | | 5 000 |
| ගෙවිය යුතු බිල්පත් | 10 000 | ආයෝජන (රජයේ සුරක්ෂිතයන්ගේ) | | 15 000 |
| ගෙවිය යුතු වියදම් | 1 000 | ණයගැතියෝ | | 20 000 |
| බදු සඳහා වෙන් කිරීම් | 13 000 | තොග | | 30 000 |
| මුළු ජංගම වගකීම් | 30 000 | මුළු ජංගම වත්කම් | | 70 000 |
| උකස් බැංකු ණය | 70 000 | ජංගම නොවන වත්කම් | 180 000 | |
| | | සමුච්චිත ක්ෂය | (50 000) | 130 000 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 60 000 | | | |
| සංචිත | 40 000 | | | |
| | **200 000** | | | **200 000** |

අතිරේක තොරතුරු :

කොටසක වෙළඳපොල මිල රු. 50 කි.

අවශ්‍ය වන්නේ :

පහත සඳහන් එක් එක් කාණ්ඩයට අදාළව අනුපාත දෙක බැගින් ගණනය කරන්න.

ලාභදායිත්වය, ද්‍රවශීලතාව, ආයෝජන, ක්‍රියාකාරකම්

*(ලකුණු 10 යි)*

[ 3 වැනි පිටුව බලන්න.

3. 2017 දෙසැම්බර් මාසය තුළදී නුවර ව්‍යාපාරිකයින්ගේ පහත සඳහන් ගනුදෙනු සිදු වී ඇත.

(i) දෙසැම්බර් මස අගදී එක් රථයක් රු. මිලියන 2 කට විකුණූ අතර ඉන් 80% ක් මුදලින් ද ඉතිරි 20% සඳහා මාසයක කාලයක ඉදිරි දින සටහන් කොට චෙක්පතක් ද ලබා ගන්නා ලදී.

මෙම රථය මිලට ගෙන ඇත්තේ 2015 ජනවාරි මස මුලදී රු. මිලියන 4 කට ය. ක්ෂය ප්‍රමාණය වර්ෂයකට පිරිවැය මත 20% ලෙස ගණන් බලා ඇත.

(ii) දෙසැම්බර් මාසයේ මුළු විකුණුම් රු. මිලියන 6 කි. මින් 70% ක් ණයට වූ අතර ඉතිරිය අත්පිට විය. සාමාන්‍ය බොල්ණය ප්‍රමාණය ණයට විකුණුම්වලින් 5% ක් වේ. දෙසැම්බර් මාසයේ ආරම්භයේ හා අවසානයේ වෙළඳ ණයගැතියන්ගේ ශේෂයන් වූයේ පිළිවෙළින් රු. මිලියන 3 ක් සහ රු. මිලියන 2·5 කි.

(iii) දෙසැම්බර් මාසයේ මුළු ගැනුම් ප්‍රමාණය රු. මිලියන 5 කි. මින් 50% ක් ඉන්වොයිස් මිලෙන් 10% ක වෙළඳ වට්ටම් සහිතව ගෙවා දමා ඇත.

(iv) දෙසැම්බර් මාසයේ මුළු මෙහෙයුම් වියදම, රු. මිලියන 1 ක ක්ෂයවීම් ද ඇතුළුව රු. මිලියන 3 කි.

මින් ගෙවීම් සිදු කර ඇත්තේ 80% ක් පමණි.

(v) ආදායම් බදු වගකීම රු. මිලියන 2 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර ඉන් 70% ක් දෙසැම්බර් මසදී ගෙවන ලදී.

(vi) බැංකුව විසින් බෙදාහැරීමේ වෑන් රථයක් මිල දී ගැනීම සඳහා රු. මිලියන 10 ක මූල්‍ය කල්බදු පහසුකමක් දෙසැම්බර් මාසයේදී ලබා දී ඇත. මේ සඳහා මූලික ගෙවීම් ලෙස රු. 500 000 ක් ගෙවූ අතර පළමු වාරිකය ගෙවිය යුතු වන්නේ 2018 ජනවාරි මසදී ය.

(vii) දෙසැම්බර් මස නිකුත් කිරීමට තීරණය කළ කොටස්වල වටිනාකම රු. මිලියන 20 කි.

මෙම නිකුතුව සඳහා ඉල්ලීම් කර ඇති ප්‍රමාණය තුන් ගුණයක් විය. මෙම අතිරික්ත මුදල් සම්බන්ධයෙන් තීරණයක් මෙතෙක් ගෙන නොමැත.

(viii) දෙසැම්බර් මාසයේ අත්පත් කර ගත් ඉඩම්වල වටිනාකම රු. මිලියන 40 කි. ගෙවීම් සිදු කරනු ලැබුවේ රු. මිලියන 35 ක කොටස් නිකුතුවකින් සහ ඉතිරිය මුදලිනි.

(ix) දෙසැම්බර් මස 01 දිනට ගෙවිය යුතු ණය ගිණුමේ ශේෂය රු. මිලියන 50 කි. මෙහි වාර්ෂික පොලිය 15% ක් වන අතර එය සෑම මසකම ව්‍යාපාරයේ ජංගම ගිණුමෙන් අය කෙරෙයි. මීට අමතරව ව්‍යාපාරයේ ජංගම ගිණුමෙන් අයකර ඇති බැංකු ගාස්තුව රු. 25 000 කි.

(x) ප්‍රකාශිත ලාභාංශ ප්‍රමාණය රු. මිලියන 5 කි. අධ්‍යක්ෂවරුන් විසින් මින් 60% ක් කොටස්වලින් ද ඉතිරිය මුදලින් ද දෙසැම්බර් මසදී ගෙවා දමන ලදී.

(xi) 2017 දෙසැම්බර් 01 දිනට මුදල් හා මුදල් සමානදෑහි අගය රු. මිලියන 3 ක අයිරාවකි.

අවශ්‍ය වන්නේ :

2017 දෙසැම්බර් 31 න් අවසන් මාසය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

*(ලකුණු 20 යි)*

[ 4 වැනි පිටුව බලන්න.

**4.** (a) ගාලු වෙළඳුන්ගේ බැංකු ගිණුමේ බැර ශේෂය (අයිරාව) රු. 50 000 ක් වූ අතර 2017 දෙසැම්බර් 31 ට බැංකු ප්‍රකාශනයේ ශේෂය සමග සමාන නොවීය. මෙම ශේෂ දෙකේ වෙනසට හේතු මෙසේ යැයි ගිණුම් සහයක විසින් තහවුරු කර දී ඇත.

(i) ගෙවීම් සඳහා බැංකුව වෙත ඉදිරිපත් කර නැති චෙක්පත්වල මුළු වටිනාකම රු. 65 000 කි.

(ii) බැංකු ගාස්තු ලෙස අයකර ඇති රු. 2 000 ව්‍යාපාරයේ මුදල් පොතේ සටහන් කර නැත.

(iii) ගනුදෙනුකරුවකු විසින් බැංකුව වෙත කර ඇති සෘජු බැර කිරීම් රු. 15 000 කි.

(iv) ගනුදෙනුකරුවකුට නිකුත් කළ රු. 20 000 චෙක්පත සඳහා බැංකුව මුදල් ගෙවා ඇත. එය ව්‍යාපාරයේ පොත්වල සටහන් වී ඇත්තේ රු. 2 000 ලෙසයි.

(v) 2017 දෙසැම්බර් 31 දිනට, තැන්පත් කළ නමුත් උපලබ්ධි වී නැති චෙක්පත්වල වටිනාකම රු. 30 000 කි.

අවශ්‍ය වන්නේ :

(1) 2017 දෙසැම්බර් 31 දිනට සංශෝධිත මුදල් ශේෂය

(2) 2017 දෙසැම්බර් මස සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශය

*(ලකුණු 10 යි)*

(b) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මාතර පොදු සමාගම සතු 18%, රු. 100 වරණීය කොටස් ආයෝජන ගිණුමේ ආයෝජනවලට අදාළ ගනුදෙනු මෙසේ ය. ලාභාංශ ප්‍රකාශ කිරීම හා ගෙවීම සෑම වසරකම මාර්තු මස සහ සැප්තැම්බර් මස අගදී සිදු කෙරේ.

| | |
|---|---|
| ජනවාරි 15 | - 18%, රු. 100 වරණීය කොටස් 20 000 ක් රු. මිලියන 3·5 කට මිල දී ගනියි. |
| ජනවාරි 31 | - මෙම කොටස්වලින් කොටස් 5 000 ක් රු. මිලියන 1 කට ලාභාංශ සහිතව විකුණන ලදී. |
| මාර්තු 31 | - අවසන් ලාභාංශ ලැබුණි. |
| ජූනි 30 | - 18%, රු 100 වරණීය කොටස් 10 000 ක් රු. මිලියන 1·5 කට ලාභාංශ රහිතව මිල දී ගන්නා ලදී. |
| සැප්තැම්බර් 30 | - අතුරු ලාභාංශ ලැබුණි. |
| දෙසැම්බර් 31 | - 18%, රු. 100 වරණීය කොටසක වෙළඳපල මිල රු. 220 කි. |

අදාළ බදු, තැරැව්කාර ගාස්තු හා වෙනත් ගාස්තු නොසලකා හරින්න.

අවශ්‍ය වන්නේ :

(1) 2017 වර්ෂය සඳහා 18%, රු. 100 වරණීය කොටස් ආයෝජන ගිණුම

(2) 2017 දෙසැම්බර් 31 වන දිනට මෙම ආයෝජනයට අදාළ ශේෂ පත්‍ර උධෘත

*(ලකුණු 15 යි)*

*(මුළු ලකුණු 25 යි)*

**5.** (a) යාපන වෙළෙන්දෝ 2015 ජනවාරි 01 දින වාර්ෂික කල්බදු වාරිකය ලෙස රු. 420 000 ක ගෙවීමක් වර්ෂය අගදී කරනා බවට එකඟව යන්ත්‍රයක් සඳහා අවලංගු කළ නොහැකි වසර 5 ක මූල්‍ය කල්බදු ගිවිසුමකට ඇතුළත් විය.

මෙම යන්ත්‍රයෙහි 2015 ජනවාරි 01 දින අත්පිට විකුණුම් මිල වූයේ රු. මිලියන 1·5 කි.

අවශ්‍ය වන්නේ :

(1) කල්බදු කාල සීමාවට අදාළ මුළු කල්බදු පොලී ප්‍රමාණය ගණනය කරන්න.

(2) කල්බදු කාල සීමාවේ එක් එක් ගිණුම් වර්ෂය සඳහා අදාළ වන කල්බදු පොලිය, sum of digits method ක්‍රමය භාවිත කර වෙන් වෙන් වශයෙන් ගණනය කරන්න.

(3) 2017 දෙසැම්බර් 31 දිනට යාපන වෙළෙන්දෝ පිළියෙල කරන ශේෂ පත්‍රයේ මෙම කල්බදු ගනුදෙනුවට අදාළ උධෘත දක්වන්න. යන්ත්‍රය පිරිවැය මත 20% ක් ක්ෂය කරයි.

*(ලකුණු 05 යි)*

[ 5 වැනි පිටුව බලන්න.

(b) බීටා පොදු සමාගම තම ප්‍රධාන කාර්යාලය කොළඹ ද එහි ශාඛාව ත්‍රිකුණාමලයේ ද පවත්වා ගෙන යයි. ඔවුන්ගේ පොත්වලින් ප්‍රධාන කාර්යාලයේ සහ ශාඛාවේ 2017 දෙසැම්බර් 31 දිනට උපුටා ගත් ශේෂ ඇසුරෙන් පිළියෙල කළ ශේෂ පිරික්සුම මෙසේ ය.

| | ප්‍රධාන කාර්යාලය | | ශාඛාව | |
|---|---|---|---|---|
| | හර (රු.) | බැර (රු.) | හර (රු.) | බැර (රු.) |
| පරිපාලන වියදම් | 135 000 | – | 9 000 | – |
| ශාඛා ජංගම ගිණුම | 46 000 | – | – | – |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | – | 300 000 | – | – |
| බැංකු මුදල් | 19 000 | – | 2 000 | – |
| ණය හිමියෝ | – | 22 500 | – | 5 000 |
| ණය ගැතියෝ | 15 000 | – | 20 000 | – |
| බෙදාහැරීමේ වියදම් | 30 000 | – | 12 000 | – |
| ශාඛාවට යැවූ භාණ්ඩ | – | 166 000 | – | – |
| ප්‍රධාන කාර්යාලයේ ජංගම ගිණුම | – | – | – | 24 000 |
| යන්ත්‍ර සූත්‍ර (ශුද්ධ අගය) | 383 000 | – | 38 000 | – |
| ලාභාලාභ ගිණුම 2017.01.01 | – | 28 000 | – | – |
| උපලබ්ධි නොවූ ලාභ වෙන් කිරීම 2017.01.01 | – | 1 500 | – | – |
| ගැනුම් | 225 000 | – | 154 000 | – |
| විකුණුම් | – | 350 000 | – | 215 000 |
| 2017.01.01 තොගය පිරිවැයට/ ශාඛාවට වූ පිරිවැයට | 15 000 | – | 9 000 | – |
| | **868 000** | **868 000** | **244 000** | **244 000** |

අතිරේක තොරතුරු:

(i) 2017 දෙසැම්බර් 31 දිනට තොග අගය කර ඇත්තේ :

| | රු. |
|---|---|
| – ප්‍රධාන කාර්යාලය පිරිවැයට | 20 000 |
| – ශාඛා තොගය - ශාඛාවට වූ පිරිවැයට | 24 000 |
| – මාර්ගස්ථ තොග - ශාඛාවට වූ පිරිවැයට | 12 000 |

(ii) ප්‍රධාන කාර්යාලය මිල දී ගන්නා භාණ්ඩ ශාඛාවට මාරු කිරීමේ දී පිරිවැයට 20% ක ලාභ ආන්තිකයක් එකතු කරයි.

(iii) 2017 දෙසැම්බර් 31 දින ශාඛාව විසින් ප්‍රධාන කාර්යාලයට එවන ලද රු. 10 000 ක මුදල පිළිබඳව කිසිදු සටහනක් ප්‍රධාන කාර්යාලයේ පොත්වල වාර්තා වී නැත.

අවශ්‍ය වන්නේ :

ප්‍රධාන කාර්යාලයේත්, ශාඛාවේත්, සමාගමේත් 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙළඳ හා ලාභාලාභ ගිණුම

*(ලකුණු 15 යි)*

*(මුළු ලකුණු 20 යි)*

* * *

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ
සීමිත / විවෘත තරඟ විභාගය – 2016 (2018)

## (02) මූල්‍ය ගණකාධිකරණය - II වන පත්‍රය

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. (පැ තුනයි)

1. අනුර, බිනුර හා චතුර ව්‍යාපාරයක හවුල්කරුවෝ වෙති. ලාභ විසර්ජනය කිරීමට පෙර 2017 මාර්තු 31 දිනට ව්‍යාපාරයේ සාරාංශ ගත ගිණුම් ශේෂ පහත දැක්වේ.

| | හර රු. ('000) | බැර රු. ('000) |
|---|---|---|
| ජංගම නොවන වත්කම් | 1 750 | – |
| ජංගම වත්කම් | 550 | – |
| හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් 01.04.2016 දිනට | | |
| - අනුර | – | 600 |
| - බිනුර | – | 400 |
| - චතුර | – | 400 |
| හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් | | |
| - අනුර | 40 | – |
| - බිනුර | – | 180 |
| - චතුර | – | 100 |
| වර්ෂයේ ලාභය | – | 570 |
| ජංගම වගකීම් | – | 90 |
| | **2 340** | **2 340** |

අතිරේක තොරතුරු ;

(i) 2016 දෙසැම්බර් 31 දින චතුර ව්‍යාපාරයෙන් ඉවත්වන තුරු අනුර, බිනුර හා චතුර ලාභ අලාභ සම සමව බෙදා ගත්හ.

(ii) අනුර හා බිනුර ලාභ අලාභ පිළිවෙළින් 2 : 1 අනුපාතයට බෙදා ගනිමින් 2017 ජනවාරි 01 දින සිට ව්‍යාපාරික කටයුතු අඛණ්ඩව පවත්වා ගැනීමට එකඟ වූහ.

(iii) හවුල්කරුවන්ගේ ගිවිසුම්වල තිබූ තෝරාගත් තොරතුරු කිහිපයක් පහත වගුවේ දක්වා ඇත.

| | 2016 දෙසැම්බර් 31 තෙක් | 2017 ජනවාරි 01 සිට |
|---|---|---|
| හවුල්කරුවන්ගේ මාසික වැටුප් (රු.) | අනුර : 40 000<br>බිනුර : 30 000<br>චතුර : 20 000 | අනුර : 50 000<br>බිනුර : 50 000 |
| ප්‍රාග්ධනය මත පොළිය | ආරම්භක ප්‍රාග්ධන ශේෂය මත වර්ෂයකට 10% | හිමිකමක් නැත. |
| මාසික දුරකථන දීමනාව (රු.) | හිමිකමක් නැත. | එක් අයකුට 5 000 බැගින් |

(iv) ප්‍රාග්ධන ශේෂය මත පොළිය ගෙවා නොතිබුණි.

(v) හවුල්කරුවන්ගේ වැටුප් මාසික හිඟයක් සහිතව ගෙවනු ලැබේ. කෙසේ නමුත්, වැරදීමකින් පැරණි ගිවිසුමට අනුව චතුර ද ඇතුළු සියලු හවුල්කරුවන්ට 2017 පෙබරවාරි මාසය තෙක් වැටුප් ගෙවා ඇත.

(vi) චතුර හවුල් ව්‍යාපාරයෙන් ඉවත් වූ දින හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 600 000 කට ඇස්තමේන්තු කර ඇත. කීර්තිනාමය වත්කමක් ලෙස හඳුනාගන්නවා වෙනුවට එය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් ගැළපීමට එකඟ වී තිබිණි.

(vii) පිරිවැය හා විකුණුම් මිල පිළිවෙළින් රු. 20 000 ක් හා රු. 30 000 ක් වූ භාණ්ඩ චතුර විසින් ව්‍යාපාරයෙන් ගෙන ගොස් තිබුණි. එවැනි විකුණුම්, සාමාන්‍ය විකුණුම් ලෙස සලකා වාර්තා කිරීම එකඟතාවයි. කෙසේ නමුත් මෙම ගනුදෙනුව පිළිබඳ කිසිදු සටහනක් පොත්වල ඇතුළත් වී නොතිබුණි.

(viii) අනුරට අයත් ගොඩනැගිල්ලක ව්‍යාපාරය පවත්වාගෙන යන අතර එය පාවිච්චි කිරීම වෙනුවෙන් මසකට රු. 40 000 ක කුලියක් ගෙවීමට එකඟ වී ඇත. සෑම වසරකම ජනවාරි 01 දින වාර්ෂික කුලිය කලින් ගෙවාදමන අතර අවසාන වරට ගෙවූ මුළු මුදලම වියදමක් සේ හඳුනාගෙන ඇත.

(ix) චතුර ව්‍යාපාරයෙන් ඉවත් වූ දින මුදලින් රු. 200 000 ක් ඔහුට ගෙවූ අතර ඔහුට හිමි ඉතිරි මුදල පොළී රහිතව මාස හයක් ඇතුළත ගෙවීමට එකඟ විය. චතුරට ගෙවූ මුදල වැරදීමකින් වියදමක් ලෙස හඳුනාගෙන ඇත.

(x) භාණ්ඩ නිෂ්පාදනය සම්බන්ධයෙන් බිනුර සතු නිපුණතාව සඳහා රු. 100 000 ක විශේෂ වාර්ෂික දීමනාවක් ගෙවනු ලබයි. වර්ෂය තුළදී රු. 70 000 ක් ඔහුට ගෙවා තිබූ අතර එම මුදල ඔහුගේ ජංගම ගිණුමට හර කර ඇත. මේ පිළිබඳව වෙනත් කිසිදු සටහනක් පොත්වල තබා නැත.

(xi) වර්ෂය සඳහා හඳුනාගත් ක්ෂයවීම් රු. 110 000 ක් වූ අතර එය රු. 90 000 ක් අඩුවෙන් වාර්තා කිරීමකි.

(xii) හවුල්කරුවන්ගේ දුරකථන දීමනාව මෙතෙක් ගෙවා නොතිබූ අතර හඳුනාගෙන ද නොතිබුණි.

(xiii) 2017.03.31 දිනට තොගයේ ශුද්ධ උපලබ්ධි අගය රු. 60 000 ක් විය. කෙසේ නමුත් ජංගම වත්කම්වල ඇතුළත් කර තිබූ තොගය, පිරිවැයට හඳුනාගෙන තිබූ අතර එය රු. 70 000 කි.

(xiv) ජංගම වත්කම්වල ඉදිරිපත් කර ඇති, හවුල්කරුවන් විසින් වර්ෂය තුළ සිදු කළ අනෙකුත් මුදල් ගැනීම් පහත පරිදි විය.

| | |
|---|---|
| අනුර | රු. 30 000 |
| බිනුර | රු. 25 000 |
| චතුර | රු. 20 000 |

(xv) අනුර තම ජංගම ගිණුමේ තිබූ ආරම්භක හර ශේෂය වූ රු. 40 000 හවුල් ගිවිසුමට අනුව මුදලින් ගෙවා පියවා ඇත. කෙසේ නමුත් මෙම මුදල ණයගැති පාලන ගිණුමට බැර කර තිබුණි.

(xvi) රු. 45 000 ක මුදල් ශේෂයක් ද ඇතුළුව, 2016.04.01 දිනට තිබූ මුළු ජංගම වත්කම් රු. 480 000 ක් විය. 2017.03.31 දිනට මුදල් ශේෂය රු. 70 000 කි.

(xvii) 2016.04.01 දිනට මුළු ජංගම වගකීම් රු. 125 000 ක් විය.

(xviii) වර්ෂය තුළ ලාභය සමානව උපයා ඇතැයි උපකල්පනය කරන්න.

**අවශ්‍ය වන්නේ ;**

(1) වර්ෂයේ ලාභය නිවැරදි කළ ආකාරය දක්වන ප්‍රකාශයක්

(2) 2016.12.31 න් අවසන් මාස නවය සඳහා හා 2017.03.31 න් අවසන් මාස තුන සඳහා වෙන වෙනම විසර්ජන ගිණුම්

(3) 2017.03.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

(4) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්

(5) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්

(6) 2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රමාණය

*(ලකුණු 40 යි)*

[තුන්වන පිටුව බලන්න.

**2.** 2017 මාර්තු 31 දින "Best" නිෂ්පාදකයන්ගේ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| ගිණුම් ශීර්ෂය | හර රු. ('000) | බැර රු. ('000) |
|---|---|---|
| ඉඩම් | 5 000 | – |
| ගොඩනැගිලි | 4 000 | – |
| මෝටර් රථ | 2 000 | – |
| යන්ත්‍ර | 7 000 | – |
| සමුච්චිත ක්ෂය - ගොඩනැගිලි | – | 200 |
| - මෝටර් රථ | – | 800 |
| - යන්ත්‍ර | – | 2 500 |
| ලැබිය යුතු ඇ | 900 | – |
| අමුද්‍රව්‍ය තොග | 370 | – |
| නිමි භාණ්ඩ තොග | 620 | – |
| නොනිමි භාණ්ඩ තොග | 200 | – |
| වේතන - වක්‍ර (කර්මාන්ත ශාලාව) | 5 450 | – |
| වේතන - සෘජු (කර්මාන්ත ශාලාව) | 12 300 | – |
| වේතන කාර්යාලය | 2 080 | – |
| ගොඩනැගිලි නඩත්තුව | 200 | – |
| වරිපනම් | 30 | – |
| මෝටර් රථ රක්ෂණය | 40 | – |
| යන්ත්‍ර අලුත්වැඩියාව | 120 | – |
| අතිකාල දීමනා (කර්මාන්ත ශාලා) | 4 000 | – |
| අමුද්‍රව්‍ය ගැනුම් | 25 000 | – |
| වේතන අත්තිකාරම් | 40 | – |
| EPF ගෙවීම් | 4 800 | – |
| ETF ගෙවීම් | 590 | – |
| වේතන අත්තිකාරම් අයකර ගැනීම් | – | 340 |
| දෙන ලද වේතන අත්තිකාරම් | 350 | – |
| ගෙවිය යුතු EPF | – | 325 |
| ගෙවිය යුතු ETF | – | 53 |
| මෝටර් රථ ධාවන වියදම් | 950 | – |
| කර්මාන්ත ශාලාව සඳහා ඉන්ධන හා බලය | 800 | – |
| විදුලිබලය | 600 | – |
| සන්නිවේදන වියදම් | 280 | – |
| ගෙවන ලද පුරස්කාරය (royalty) | 2 500 | – |
| ගෙවිය යුතු ඇ | – | 482 |
| ඇසුරුම් ද්‍රව්‍ය | 80 | – |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | – | 25 000 |
| රඳවූ ඉපයුම් | – | 22 000 |
| විකුණුම් | – | 30 000 |
| මුදල් ශේෂය | 1 400 | – |
| | **81 700** | **81 700** |

[හතරවන පිටුව බලන්න.

අතිරේක තොරතුරු ;

(i) 2017 මාර්තු 31 දිනට තොග පිරිවැය (නොනිමි තොග මිනුම් කරනු ලබන්නේ ප්‍රාථමික පිරිවැයටයි.)

නිමි තොග - රු. 410 000

නොනිමි තොග - රු. 540 000

අමුද්‍රව්‍ය - රු. 130 000

(ii) ගොඩනැගිලිවලින් 20% ක පමණ ප්‍රමාණයක් භාවිත කරනුයේ කාර්යාල ප්‍රයෝජනය සඳහා ය.

(iii) සියලු වේතන සෑම මාසයක් අවසාන වීමට ප්‍රථම ගෙවනු ලබයි. EPF හා ETF දායක මුදල් ඊළඟ මාසයේ 15 දිනට පෙර ගෙවනු ලබයි. 2017 මාර්තු මාසය සඳහා වේතන සාරාංශය පහත දී ඇත. 2017 මාර්තු මාසය සඳහා වේතන වියදම ලෙස හඳුනාගෙන ඇත්තේ ගෙවූ ශුද්ධ වේතනය පමණි.

| | කර්මාන්තශාලාව රු. ('000) | කාර්යාලය රු. ('000) |
|---|---|---|
| දළ වේතනය | 1 500 | 200 |
| අඩු කිරීම් | | |
| - EPF | 150 | 20 |
| - වැටුප් අත්තිකාරම් | 25 | – |
| ශුද්ධ වේතනය | **1 325** | **180** |
| සේවායෝජකගේ දායකය | | |
| - EPF | 225 | 30 |
| - ETF | 45 | 6 |

(iv) වේතන අත්තිකාරම් ගිණුමේ පෙන්වනුයේ 2016.04.01 දිනට තිබූ ශේෂයයි.

(v) ගෙවිය යුතු EPF හා ETF ගිණුම් පෙන්වනුයේ 2016.04.01 දිනට තිබූ ශේෂයන්ය.

(vi) නිෂ්පාදන තාක්ෂණය සඳහා මුළු විකුණුම් වටිනාකමින් 10% ක් පුරස්කාර (royalty) ලෙස ගෙවිය යුතුයි.

(vii) මෝටර් රථවලට අදාළ වියදම්වලින් 50% ක් නිෂ්පාදන පිරිවැය ලෙස හඳුනාගත යුතුයි.

(viii) සමස්ත සන්නිවේදන වියදම්, පරිපාලන වියදම් ලෙස සැලකිය යුතු අතර විදුලියෙන් 75% ක් භාවිත කරනු ලබන්නේ කර්මාන්ත ශාලාව සඳහායි.

(ix) වර්ෂය සඳහා ක්ෂය, පහත පරිදි හඳුනාගත යුතුයි.

ගොඩනැගිලි - රු. 100 000

යන්ත්‍ර - රු. 400 000

මෝටර් රථ - රු. 300 000

අවශ්‍ය වන්නේ ;

(1) 2017 මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා නිෂ්පාදන ගිණුම

(2) පහත සඳහන් ගැළපිලි වාර්තා කිරීමට ජර්නල් සටහන්

EPF හා ETF

වේතන අත්තිකාරම්

පුරස්කාර වියදම

ක්ෂයවීම්

(3) 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වේතන අත්තිකාරම් ගිණුම

*(ලකුණු 20 යි)*

**3.** රජයේ ගණකාධිකාරිවරුන් කණ්ඩායමක් විසින් සුබසාධක සංගමයක් පිහිටුවා ගෙන ඇත. මෙම සංගමයේ සාමාජිකයින් 800 ක් සිටින අතර එක් අයකුගේ මාසික සාමාජික මුදල රු. 100 කි. සංගමය විසින් ආපනශාලාවක්ද පවත්වා ගෙන යයි. මාර්තු 31 දිනට පොත්පත්වලට අනුව සංගමයේ වත්කම් හා වගකීම් පහත දී ඇත.

| | **2017.03.31** දිනට | **2016.03.31** දිනට |
|---|---|---|
| | රු. | රු. |
| ලී බඩු | 65 000 | 65 000 |
| රූපවාහිනී යන්ත්‍රය | 40 000 | 40 000 |
| බැංකු ශේෂය - සංගමය | 61 500 | 126 500 |
| බැංකුවල ඇති ස්ථාවර තැන්පතු | 2 500 000 | 2 000 000 |
| ඉතිරි කිරීමේ ගිණුම් ශේෂය | 24 000 | 10 000 |
| බැංකු ශේෂය - ආපනශාලාව | 607 000 | (76 000) |
| අයවිය යුතු සාමාජික මුදල් | 3 000 | 8 000 |
| ආහාර ද්‍රව්‍ය තොග | 2 100 000 | 1 750 000 |
| සේවා සපයන්නන්ට ගෙවිය යුතු දෑ | 12 000 | 9 000 |
| කලින් ලද සාමාජික මුදල් | 6 000 | – |

අතිරේක තොරතුරු ;

(i) වර්තමාන පොළී අනුපාතයට වාර්ෂිකව අලුත් කිරීමේ පදනම මත ස්ථාවර තැන්පතු පවත්වා ගනු ලබයි. 2016.01.01 දින තැන්පතුව කල්පිරුණු අතර එදිනට වාර්ෂිකව 12% පොළී අනුපාතයට අලුත් කරන ලද වටිනාකම රුපියල් මිලියන 2 කි. 2017.01.01 දින තවත් රු. 500 000 තැන්පත් කරන ලද අතර එදිනට ලබාදුන් පොළී අනුපාතය වාර්ෂිකව 13% කි. බැංකුව පොළිය වාර්ෂිකව උපචිත කරනු ලබන නමුත්, සංගමය 2016.01.01 දින සිට පොළිය හඳුනාගෙන නොමැත.

(ii) 2017.03.31 දිනට ඉතිරි කිරීමේ පාස්පොත රු. 28 500 ක ශේෂයක් පෙන්වනු ලබන අතර සංගමය නිසි පරිදි සියලු තැන්පතු හා ආපසු ගැනීම් වාර්තා කර ඇත.

(iii) ආපනශාලාවට අදාළ සියලු ලැබීම් හා ගෙවීම් ඒ සඳහා පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුම මගින් සිදු කරයි. මෙම ගිණුමේ සාරාංශයක් පහත දී ඇත.

| | රු. |
|---|---|
| 2016.04.01 දිනට අයිරාව | (76 000) |
| විකුණුම් | 14 000 000 |
| සංගමයෙන් ලද මුදල් | 85 000 |
| භාණ්ඩ සැපයුම්කරුවන්ට ගෙවීම් | (8 000 000) |
| වේතන | (1 351 300) |
| ගොඩනැගිලි කුලිය | (240 000) |
| උපකරණ සඳහා කුලිය | (600 000) |
| විදුලිය | (135 000) |
| ජලය | (12 700) |
| දුරකථන ගාස්තු | (63 000) |
| සංගමයට මාරු කිරීම් | (3 000 000) |
| 2017.03.31 දිනට ශේෂය | 607 000 |

(iv) ආපනශාලාවේ බැංකු ප්‍රකාශනවලට අනුව බැංකු ගාස්තු හා පොළී ප්‍රමාණය රු. 4 050 ක් බව හෙළිදරව් කරගෙන ඇත.

[හයවන පිටුව බලන්න.

(v) සුබසාධක සංගමයේ බැංකු ගිණුමේ සාරාංශය පහත දී ඇත.

| | රු. |
|---|---|
| 2016.04.01 දිනට ශේෂය ........................................ | 125 500 |
| ආපනශාලාවෙන් ලද මුදල් ........................................ | 3 000 000 |
| සාමාජික ගාස්තු ලැබීම් ........................................ | 971 000 |
| ඉතිරිකිරීමේ ගිණුමේ තැන්පතු ........................................ | (14 000) |
| පරිපාලන වියදම් ........................................ | (115 000) |
| ස්ථාවර තැන්පතු ........................................ | (500 000) |
| සුබසාධන වියදම් ........................................ | (3 316 500) |
| පුවත්පත් බිල්පත් ........................................ | (5 500) |
| ආපනශාලාවට මුදල් මාරු කිරීම් ........................................ | (85 000) |
| 2017.03.31 දිනට ශේෂය ........................................ | **61 500** |

(vi) ගෘහභාණ්ඩ හා රූපවාහිනිය පිරිවැයට හඳුනාගෙන ඇත. ආරම්භයේ සිටම මේ සඳහා ක්ෂය වෙන්කර නොමැත. ගෘහභාණ්ඩ හා රූපවාහිනියේ සාධාරණ අගයන් පිළිවෙළින් ඒවායේ පිරිවැයෙන් 70% ක් හා 30% ක් බව ඇස්තමේන්තු කර ඇත. සංගමය ඒවා සාධාරණ අගයට හඳුනාගැනීමට තීරණය කර ඇත.

අවශ්‍ය වන්නේ ;

(1) 2017 මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ආපනශාලාවේ ලාභය හෝ පාඩුව පෙන්වන ප්‍රකාශයක්

(2) 2017 මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සංගමයේ ආදායම් ප්‍රකාශය

(3) 2016.03.31 දින සිට 2017.03.31 දක්වා සංගමයේ සමුච්චිත අරමුදල වෙනස් වූ ආකාරය දක්වන ප්‍රකාශයක්

*(ලකුණු 20 යි)*

**4.** පහත තොරතුරු 'Entrust' ඉදිකිරීම් සමාගමට ප්‍රදානය කරන ලද ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවකට අදාළ වේ.

| | රු. ('000) |
|---|---|
| ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් වටිනාකම ........... | 5 000 000 |
| ඇස්තමේන්තු මුළු වියදම ........................................ | 3 600 000 |

මෙම කොන්ත්‍රාත්තුවට අදාළ අනෙකුත් තොරතුරු පහත පරිදි වේ.

| | 2016.03.31 දිනට රු. ('000) | 2017.03.31 දිනට රු. ('000) |
|---|---|---|
| එදිනට වැය කළ පිරිවැය ........................................ | 1 300 000 | 2 650 000 |
| සහතික කළ වැඩවල වටිනාකම ........................... | 1 750 000 | 3 450 000 |
| ප්‍රගතිය මත ගෙවූ මුදල් ලැබීම් ............................... | 800 000 | 2 000 000 |
| මුදල් රඳවා ගැනීම .................................................. | 10% | 10% |

කොන්ත්‍රාත් මිල රු. බිලියන 5.4 දක්වා වැඩි කිරීමට දෙපාර්ශ්වය 2016.12.31 දින එකඟ වී ඇත. සංශෝධිත පිරිවැය ඇස්තමේන්තුවට අනුව ඉදිකිරීම නිම කිරීමට තවත් රු. බිලියන 2 ක් වැය වන බව හෙළිදරව් කරගෙන ඇත.

අවශ්‍ය වන්නේ ;

(1) 2017.03.31 හා 2016.03.31 දිනෙන් අවසන් වර්ෂ සඳහා කොන්ත්‍රාත් ගිණුම, කොන්ත්‍රාත් ලැබිය යුතු ගිණුම හා රඳවූ මුදල් ගිණුම

(2) 2017.03.31 දිනට සහ 2016.03.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශවල උධෘත

*(ලකුණු 10 යි)*

**5.** 2017.03.31 න් අවසන් වර්ෂයට අදාළව ප්‍රධාන කාර්යාලයට හා ශාඛාවකට සම්බන්ධ ගනුදෙනු පිළිබඳ තොරතුරු පහත දී ඇත.

| | පිරිවැය රු. ('000) | විකුණුම් මිල රු. ('000) |
|---|---|---|
| 2016.04.01 දිනට ශාඛාවේ තොගය | 10 000 | 15 000 |
| ප්‍රධාන කාර්යාලය විසින් ශාඛාවට යවන ලද භාණ්ඩ | 120 000 | 180 000 |
| ශාඛාව විසින් ආපසු එවන ලද භාණ්ඩ | 5 000 | 7 500 |
| ශාඛාවල සිදු කළ විකුණුම් | – | 135 000 |
| ගනුදෙනුකරුවන් විසින් ශාඛාව වෙත භාණ්ඩ ආපසු එවීම් | 2 000 | 3 000 |
| ගනුදෙනුකරුවන් විසින් ප්‍රධාන කාර්යාලයට ආපසු එවීම් | 4 000 | 6 000 |
| 2017.03.31 දිනට ශාඛාවේ තොගය | 20 000 | 30 000 |

**අවශ්‍ය වන්නේ ;**

(මධ්‍යගත ගිණුම් ක්‍රමය භාවිත කරන්නේ යැයි උපකල්පනය කරන්න.)

(1) 2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශාඛා තොග ගිණුම

(2) 2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශාඛාව ඉපැයූ ලාභය

*(ලකුණු 10 යි)*

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ
සීමිත / විවෘත තරග විභාගය – 2016 (2018)

## (03) පිරිවැය හා කළමනාකරණ ගණකාධිකරණය

පැ තුනයි

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

**1.** රාජ්‍ය දෙපාර්තමේන්තුවක් තමන් විසින් ලබාදෙන සේවාවල පිරිවැය හඳුනාගැනීම සඳහා කාර්ය පිරිවැය (Job Costing) ක්‍රමය යොදා ගනී. මෙහිදී එක් එක් කාර්යයට අදාළ පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය සඳහා සේවකයින් වැඩකළ පැය ගණන පදනම ලෙස යොදා ගැනේ.

කළමනාකාරිත්වය විසින් පොදු කාර්ය පිරිවැය ජ්‍යෙෂ්ඨ සේවකයින් වැය කරන පැය සහ කණිෂ්ඨ සේවකයින් වැය කරන පැය අතර වෙනස සලකා අන්තර්ග්‍රහණය කිරීමට තීරණය කර ඇත. එම අගය, ජ්‍යෙෂ්ඨ සේවකයින්ගේ පැයක් සඳහා වූ රේටය, කණිෂ්ඨ සේවකයින්ගේ පැයක රේටයට අමතර 50% ක අධිභාරයක් එකතු කර ගණනය කිරීමට තීරණය විය.

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාසයට අදාළ තොරතුරු මෙසේයි.

| | අයවැයගත | සත්‍ය |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ සේවකයින්ගේ මුළු පැය ගණන | 15 000 | 20 000 |
| කණිෂ්ඨ සේවකයින්ගේ මුළු පැය ගණන | 40 000 | 45 000 |
| මාසයේ පොදු කාර්ය පිරිවැය රුපියල් මිලියන | 8.75 | 11.25 |

අවශ්‍ය වන්නේ:

(1) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාසය සඳහා පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය

(i) ජ්‍යෙෂ්ඨ සේවක පැයකට

(ii) කණිෂ්ඨ සේවක පැයකට

ගණනය කරන්න. *(ලකුණු 05 යි)*

(2) එකම කාලච්ඡේදයේ පූරෝකථනය කළ අනුපාත අනුව අන්තර්ග්‍රහණය කළ පොදු කාර්ය පිරිවැය එම කාලච්ඡේදයේ සත්‍ය වශයෙන්ම දරන ලද පොදු කාර්ය පිරිවැය සමඟ ඇතැම්විට වෙනස් වන්නේ මන්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි)*

(3) සාම්ප්‍රදායික පොදු කාර්ය පිරිවැය විභාජන ක්‍රමයේ ඇති දුර්වලතා මඟහරවා ගැනීම සඳහා බොහෝ ව්‍යාපාරික ආයතන, ක්‍රියාකාරකම් පදනම් පිරිවැයකරණය (Activity Based Costing-ABC) යොදාගැනීමට කැමැත්තක් දක්වයි. රාජ්‍ය ආයතනවලට මෙම ABC ක්‍රමය හඳුන්වා දීමෙන් ලබා ගත හැකි වාසි තුනක් සඳහන් කරන්න. *(ලකුණු 06 යි)*

*(මුළු ලකුණු 15 යි)*

**2.** ග්‍රීන් වෙජිටබල් ගාඩ්නර් (Green Vegetable Gardener-GVG) ආයතනය, උඩරට ප්‍රදේශයේ එළවලු වගාවේ නිරත වේ. එහි කළමනාකරු මෙම කන්නයට අදාළව පහත සඳහන් තොරතුරු ලබා දී ඇත.

| | අල | ගෝවා | ලීක්ස් | කැරට් |
|---|---|---|---|---|
| වගාකරන ප්‍රමාණය (අක්කර) | 25 | 20 | 30 | 25 |
| අස්වැන්න අක්කරයකට (මෙට්‍රික් ටොන්) | 10 | 15 | 08 | 12 |
| මෙට්‍රික් ටොන් 1 ක විකුණුම් මිල රු. '000 | 80 | 60 | 75 | 100 |
| අක්කරයට විචල්‍ය පිරිවැය රු. '000 : | | | | |
| පොහොර | 100 | 75 | 40 | 75 |
| බීජ | 25 | 25 | 30 | 35 |
| පලිබෝධනාශක | 75 | 25 | 30 | 55 |
| සෘජු වැටුප් | 160 | 220 | 300 | 375 |

එක් එක් කන්නය සඳහා මුළු ස්ථාවර පිරිවැය රු. 1 500 000 කි. ප්‍රමාණවත් වෙළඳපල සේවාවක් සැපයීම සඳහා GVG ආයතනය විසින් ඉහත සඳහන් සෑම එළවලු වර්ගයකින්ම අවම වශයෙන් එළවලු මෙට්‍රික් ටොන් 60 ක් සෑම කන්නයකදීම නිෂ්පාදනය කළ යුතුම වේ.

අවශ්‍ය වන්නේ:

(1) ප්‍රශස්ත නිෂ්පාදන සැලැස්ම සහ එම සැලැස්මට අනුව ලාභය හෝ අලාභය *(ලකුණු 16 යි)*

(2) සමච්ඡේදක ලක්ෂ්‍ය විශ්ලේෂණයේ සීමා දෙකක් *(ලකුණු 04 යි)*

*(මුළු ලකුණු 20 යි)*

**3.** හලාවත ප්‍රොපටි ඩිවෙලපර් (Chilaw Property Developer - CPD) ආයතනය තම ගනුදෙනුකරුවන් වෙනුවෙන් දේපල අගය කරදීමේ, ප්‍රචාරණයේ සහ විකිණීමේ නිරත සමාගමකි. කෙටි කලක් මෙම ක්ෂේත්‍රයේ නිරතවූ ඔවුහු 2018 මුල් මාස 4 සඳහා මුදල් අයවැය පිළියෙල කරමින් සිටිති.

අපේක්ෂිත දේපල විකුණුම් ඒකක ප්‍රමාණ මෙසේයි.

| මාසය | 2017 | 2018 | | | |
|---|---|---|---|---|---|
| | දෙසැම්බර් | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් |
| විකුණුම් ඒකක ගණන | 10 (සත්‍ය) | 15 | 20 | 25 | 30 |

එක් දේපල ඒකකයක සාමාන්‍ය විකුණුම් මිල රුපියල් මිලියන 5 ක් වන අතර CPD ආයතනය විකුණුම් මිලෙන් 5% ක් තම සේවාවන් වෙනුවෙන් අයකරයි. මින් 2% ක් විකුණු මාසයේදීම ලැබෙන අතර ඉතිරි 3% ලැබෙනුයේ ඊළඟ මාසයේදී ය. සමාගමේ මාසික වැටුප් ලබන කාර්ය මණ්ඩලය 10 දෙනෙකි. එක් අයකුගේ සාමාන්‍ය මාසික වැටුප රුපියල් 100 000 කි. මාසික විකුණුම් ඒකක ගණන 25 ට වඩා වැඩි නම් සෑම වැඩිවූ දේපල විකුණුම් ඒකකයක් සඳහාම අතිරේකව 50% ක ප්‍රසාද ගෙවීමක් සෑම සේවකයකුටම ලැබේ.

විචල්‍ය පිරිවැය ලෙස ඒකකයක විකුණුම් මිලෙන් 1% ක් එක් ඒකකයක් වෙනුවෙන් දැරීමට සිදුවන අතර එය එම මාසය තුළදීම ගෙවා දැමේ. රුපියල් 100 000 ක මාසික ක්ෂය ඇතුළත් මුළු ස්ථාවර පිරිවැය රුපියල් 500 000 කි. එයද එම මාසය තුළදීම ගෙවාදැමේ. පසුගිය වර්ෂයේ CPD ආයතනය 15% ක වාර්ෂික පොලී අනුපාතයකට රුපියල් මිලියන 10 ක ණය මුදලක් වසර 3 ක සහන කාලයක් (grace period) ඇතිව ලබා ගෙන ඇත. එනමුදු ණය පොලිය මාසිකව ගෙවිය යුතු වේ.

සමාගමේ ආදායම් බදු අනුපාතය සහ එකතු කළ අගය මත බද්ද (VAT) පිළිවෙළින් 30% හා 15% වේ. 2017 දී ගෙවිය යුතු ආදායම් බදු වගකීම රුපියල් මිලියන 2·5 කි. එය 2018 ජනවාරි මස ගෙවිය යුතු වේ. එම මාසය තුළදීම ඔවුන් සතු, ශුද්ධ පොත් අගය රුපියල් මිලියන 2 ක් වූ රථයක් රුපියල් මිලියන 2·3 කට විකිණීමට අදහස් කර ඇත. 2017 දෙසැම්බර් මස අගදී බැංකු ශේෂය හා මුදල් ශේෂය පිළිවෙළින් රුපියල් 200 000 අයිරාවක් හා රුපියල් 50 000 කි.

අවශ්‍ය වන්නේ:

(1) 2018 ජනවාරි සිට අප්‍රේල් දක්වා මාසික තීරු සහිතව මුදල් අයවැය ලේඛනය *(ලකුණු 10 යි)*

(2) 2018 අප්‍රේල් 30 න් අවසන් වන මාස 04 සඳහා අයවැයගත ආදායම් ප්‍රකාශය *(ලකුණු 07 යි)*

(3) මුදල් අයවැය ලේඛනයෙන් පිළිබිඹු වන අතිරේක මුදල් ආයෝජනය කිරීමේදී CPD සැලකිල්ලට ගත යුතු කරුණු තුනක් සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

*(මුළු ලකුණු 20 යි)*

**4.** ලංකා නිෂ්පාදකයන්ගේ එක් ක්‍රියාවලියකට අදාළව පසුගිය මාසයේ තොරතුරු මෙසේයි. ද්‍රව්‍ය එකතු කිරීම ක්‍රියාවලිය ආරම්භයේදීම සිදුවන අතර, අගය කිරීම ප්‍රථමයෙන් ලද ප්‍රථමයෙන් බැහැර (FIFO) ක්‍රමයට සිදු කෙරේ.

| | |
|---|---|
| ආරම්භක නොනිමි වැඩ | : ලීටර 3 000 කි. (පරිවර්තන පිරිවැයෙන් 40% ක් නිම වී ඇත.) මෙහි මුළු වටිනාකම රු. 380 000 කි. (ද්‍රව්‍ය පිරිවැය 300 000, පරිවර්තන පිරිවැය 80 000) |
| දරන ලද පිරිවැය | : එකතු කරන ලද ලීටර 20 000 ට අදාළ ද්‍රව්‍ය පිරිවැය රු. 1 600 000 කි. පරිවර්තන පිරිවැය රු. 2 000 000 කි. |
| සාමාන්‍ය අපතය | : යෙදවුම්වලින් 10% කි. සියලුම හානි, ක්‍රියාවලිය පුරාවටම සිදුවන අතර හානිවූ ලීටරයක් රු. 150 බැගින් විකිණිය හැකිය. |
| සත්‍ය නිමවුම | : මෙම ක්‍රියාවලියෙන් නිමි භාණ්ඩ ලෙස ගබඩාවට යැවූ ලීටර ගණන 16 000 කි. |
| අවසාන නොනිමි වැඩ | : ලීටර 5 000 කි. (පරිවර්තන පිරිවැයෙන් 30% ක් අවසන් වී ඇත.) |

අවශ්‍ය වන්නේ:

පසුගිය මාසයේ ක්‍රියාවලි ගිණුම, ලීටර හා රුපියල් වටිනාකම් සහිතව පිළියෙල කරන්න. *(ලකුණු 10 යි)*

**5.** (a) ගාලු වෙළඳුන් 2017 දෙසැම්බර් මාසයේ අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් 5 000 ක් මිලට ගෙන ඇත. දෙසැම්බර් මස මුලදී සහ අගදී ඇති අමුද්‍රව්‍ය තොග ප්‍රමාණය පිළිවෙළින් කිලෝග්‍රෑම් 1 000 හා 800 කි. එක් නිෂ්පාදන ඒකකයක් සඳහා අවශ්‍ය වන සම්මත අමුද්‍රව්‍ය ප්‍රමාණය කිලෝග්‍රෑම් 5 කි.

දෙසැම්බර් මාසයේ මුළු සෘජු ශ්‍රම පැය 6 000 සඳහා ගෙවා ඇති මුළු සෘජු ශ්‍රම පිරිවැය රු. 600 000 කි. ඒකකයක් සෑදීමට අවශ්‍ය වන සම්මත පැය ගණන 5·5 ක් වන අතර පැයක සම්මත ශ්‍රම පේ්‍රතය රු. 110 කි. දෙසැම්බර් මාසයේ සත්‍ය නිෂ්පාදනය ඒකක 1000 කි.

අවශ්‍ය වන්නේ:

(1) අමුද්‍රව්‍ය මිල විචලනය

(2) අමුද්‍රව්‍ය භාවිත විචලනය

(3) ශ්‍රම පේ්‍රත විචලනය

(4) ශ්‍රම කාර්යක්ෂමතා විචලනය *(ලකුණු 08 යි)*

(b) පහත සඳහන් තොරතුරු යාපනය වෙළඳුන්ගේ වාර්තාවලින් ලබා ගන්නා ලදී.

| | අයවැයගත | සත්‍ය |
|---|---|---|
| ඒකකයක විකුණුම් මිල (රු.) | 30 | 28 |
| විකුණුම් ප්‍රමාණය (ඒකක) | 9 000 | 12 000 |
| ඒකකයක විචල්‍ය පිරිවැය (රු.) | 20 | 23 |
| මුළු ස්ථාවර පොදු කාර්ය පිරිවැය (රු.) | 75 000 | 80 000 |

අවශ්‍ය වන්නේ:

(1) විකුණුම් මිල විචලනය

(2) විකුණුම් පරිමා විචලනය

(3) ස්ථාවර පොදු කාර්ය පිරිවැය පරිමා විචලනය *(ලකුණු 07 යි)*

*(මුළු ලකුණු 15 යි)*

**6.** (a) ආයතනයක අරමුණු ළඟා කර ගැනීමත් සේවක අභිප්‍රේරණය නිශ්චිතව ඇතිවීමත් මූලික කර පිහිටුවන අයවැය මධ්‍යස්ථානවල වාසි තුනක් හා අවාසි දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 10 යි)*

(b) ශූන්‍යකරණ පදනම් අයවැයකරණයෙන් (Zero Base Budgeting) රාජ්‍ය අංශයේ ආයතනයක අරමුණ (goal) ළඟා කර ගන්නේ කෙසේ ද යන්න උදාහරණ සහිතව පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

(c) රාජ්‍ය අංශයේ සංවිධානවල කාර්ය සාධන පදනම් වූ අයවැය (Performance Based Budget) ක්‍රමයක් හඳුන්වා දීමේදී ප්‍රායෝගිකව ඇතිවන ගැටලු තුනක් සඳහන් කරන්න. *(ලකුණු 05 යි)*

*(මුළු ලකුණු 20 යි)*

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ
සීමිත / විවෘත තරග විභාගය - 2016 (2018)

**(04) විගණනය හා විමර්ශනය**

පැ තුනයි

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

**1.** විගණන සැලැස්ම (audit plan) පිළියෙල කිරීමට පෙර අස්තිත්වය (entity) සහ එහි පරිසරය පිළිබඳ අවබෝධයක් ලබාගැනීම විගණකට වැදගත් වේ.

(i) විගණක විසින් ප්‍රමාණවත් අවබෝධයක් ලබාගැනීම අවශ්‍ය වන අස්තිත්වයේ ප්‍රධාන ක්ෂේත්‍ර (main areas) **හතරක්** ලැයිස්තුගත කරන්න. *(ලකුණු 06 යි)*

(ii) සමස්ත විගණන උපායමාර්ග (overall audit strategies) පිළියෙල කිරීමේදී විගණක විසින් සැලකිලිමත් විය යුතු කරුණු **පහක්** ලැයිස්තුගත කරන්න. *(ලකුණු 05 යි)*

(iii) විගණනයක් සැලසුම් කිරීමේදී වංචා හා වැරදි සම්බන්ධයෙන් විගණකට ඇති වගකීම කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 03 යි)*

(iv) විගණන අවදානම් (Audit Risk) සංරචක (components) **තුන** පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

**2.** විගණන සාක්ෂි යනු විගණන මතය සඳහා පදනම් කර ගැනීම පිණිස විගණක විසින් එළඹෙන්නා වූ නිගමනවලට පාදක වන විගණක විසින් ප්‍රයෝජනයට ගනු ලබන ප්‍රමාණාත්මක හා උචිත තොරතුරු වේ.

(i) විගණනයකදී රැස්කර ගන්නා ලද සාක්ෂිවල විශ්වාසදායී භාවය තීරණය කිරීමේදී සැලකිල්ලට ගනු ලබන සාධක **හතරක්** සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) විගණන සාක්ෂි ලබාගැනීම සඳහා විගණකයකුට ඉටු කළ හැකි විගණන ක්‍රියාපටිපාටි කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) රාජ්‍ය ආයතන විගණනයේදී විගණන සාක්ෂි ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් විගණකාධිපතිට ලබා දී ඇති අයිතිවාසිකම් මොනවා ද? *(ලකුණු 06 යි)*

(iv) විගණනයේ කාර්යයන් සඳහා අභ්‍යන්තර විගණකගේ වැඩ ප්‍රමාණවත් විය හැකි දැයි නිගමනය කිරීම සඳහා බාහිර විගණක විසින් අගය කළ යුතු ක්ෂේත්‍ර (areas) **හතරක්** ලැයිස්තුගත කරන්න. *(ලකුණු 04 යි)*

**3.** (i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් වෘත්තීය ගණකාධිකාරීවරුන් සඳහා නිකුත් කර ඇති ආචාරධර්ම සංග්‍රහය අනුව වරලත් ගණකාධිකාරීවරයකු විසින් පිළිපැදිය යුතු මූලික මූලධර්ම (Fundamental Principles) පහ ලැයිස්තුගත කරන්න. *(ලකුණු 05 යි)*

(ii) පුනරාවර්තනය වන විගණනයක් (Recurring Audit) සම්බන්ධයෙන් සෑම කාලපරිච්ඡේදයක් සඳහාම නව විගණන පත්වීමේ ලිපියක් (Engagement Letter) නොයැවීමට විගණක විසින් තීරණය කරනු ලැබිය හැකිය. කෙසේ වුවද, ඇතැම් අවස්ථාවලදී නව හෝ අතිරේක පත්වීම් ලිපියක් නිකුත් කිරීම අවශ්‍ය වනු ඇත.

නව හෝ අතිරේක පත්වීම් ලිපියක් යැවීම අවශ්‍ය වන්නා වූ අවස්ථා **හතරක්** ලැයිස්තුගත කරන්න. *(ලකුණු 06 යි)*

(iii) විකරණය කළ (modified) විගණන මත වර්ග **තුන** කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iv) විගණන අවදානම (Audit risk) සහ ව්‍යාපාර අවදානම (Business risk) කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 03 යි)*

[ 2 වැනි පිටුව බලන්න.

**4.** මූල්‍ය ප්‍රකාශනවල පහත දැක්වෙන එක් එක් අයිතමය සම්බන්ධයෙන් ඔබ ගනු ලබන විගණන ක්‍රියාපටිපාටි මොනවාදැයි ලැයිස්තුගත කරන්න.

(i) කල්බදු (Leases)

(ii) විලම්බිත බදු (Deferred taxation)

(iii) ඉන්වෙන්ට්‍රි (Inventories)

(iv) ආයෝජන (Investments)

*(ලකුණු 05 × 4 = 20 යි)*

**5.** කෙටි සටහන් ලියන්න.

(i) ණය ගැනුම් පිරිවැය (Borrowing Cost)

(ii) සම්බන්ධිත පක්ෂ (Related Party)

(iii) තහවුරු පරීක්ෂා (Substantive Tests)

(iv) අසම්භාව්‍ය වගකීම් (Contingent Liability)

(v) සාධාරණ අගය (Fair Value)

*(ලකුණු 04 × 5 = 20 යි)*

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ
සීමිත / විවෘත තරඟ විභාගය - 2016 (2018)

## (05) සාමාන්‍ය බුද්ධිය හා අවබෝධය

පැ තුනයි

### විභාග අපේක්ෂකයින්ට උපදෙස්

ඉතා වැදගත් :

පිළිතුරු ලිවීම සඳහා පැන්සල භාවිත නොකරන්න.



✳ පිළිතුරු සැපයීමේදී පහත සඳහන් ආකාරයට ඉලක්කම් ලියා නැති උත්තර පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

1 2 3 4

ඔබේ විභාග අංකය මෙහි ද තුන්වන හා පස්වන පිටුවල ද ලියන්න.

..................................

නිවැරදි බවට නිරීක්ෂකගේ කෙටි අත්සන

..................................

වැදගත් :

✳ මෙම ප්‍රශ්න පත්‍රය පිටු 12 කින් හා (අ) කොටසේ ප්‍රශ්න 02 කින් ද (ආ) කොටසේ ප්‍රශ්න 50 කින් ද යුක්ත වේ.

✳ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.

✳ මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය පැය තුනකි.

✳ ශාලාධිපතිවරයා නිවේදනය කළ පසු පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.

✳ ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.

✳ දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.

✳ ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත ශාලාධිපතිට භාර දිය යුතුය.

✳ ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස නිල් හෝ කළු පෑනෙන් පමණක් ලියන්න. පැන්සල් පාවිච්චි නොකරන්න.

✳ මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.

✳ අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු සහිත, මකන දියර භාවිත කරන ලද සහ පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි

| කොටස | පිටුව | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|---|
| අ | 2 | 1 (i) | |
| | 3 | 1(ii) | |
| | 4 | 2 | |
| ආ | 5 | 1 - 10 | |
| | 6 | 11 - 15 | |
| | 7 | 16 - 23 | |
| | 8 | 24 - 30 | |
| | 9 | 31 - 35 | |
| | 10 | 36 - 40 | |
| | 11 | 41 - 45 | |
| | 12 | 46 - 50 | |
| එකතුව | | | |

අවසාන ලකුණු

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂා කළේ | |

[ 2 වැනි පිටුව බලන්න.

## (අ) කොටස - අවබෝධය

**1.** (i) මෙම පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

2016 වසරේ ඇතැම් මාස මෙන්ම, 2017 වසරේ පළමු කාර්තුව තුළ දී ඉහළ උද්ධමනයක් ඇති වීම සඳහා කාලගුණික හේතු නිසා ඇතිවූ අවහිරතාවල අයහපත් බලපෑම, රජයේ බදු සංශෝධන හා ජාත්‍යන්තර භාණ්ඩ මිල ගණන් ඉහළ යෑමට හේතු වුව ද, මූලික උද්ධමනය ඉහළ මට්ටමක පැවතීම තුළින් ආර්ථිකයෙහි ඉහළ යමින් පැවති ඉල්ලුම් පීඩන පිළිබිඹු විය. දේශීය ආර්ථිකයෙහි ඇතැම් අංශ වෙතින් ආනයන සඳහා වූ ඉල්ලුම ඉහළ යෑම, සීමිත දේශීය භාණ්ඩ පැස සඳහා වන විදේශීය ඉල්ලුම දුර්වල මට්ටමක පැවතීම, විදේශීය ඍජු ආයෝජන ප්‍රවාහ ආකර්ෂණය කර ගැනීමට දිගින් දිගටම නොහැකි වීම මෙන්ම, විශේෂයෙන්ම රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ මත බලපෑම් ඇති කිරීමට හේතු වූ විදේශ පොලී අනුපාතික ඉහළ යෑමෙහි බලපෑම ද විදේශීය අංශයෙහි ගිණුම්වල විචලනයන් තුළින් පෙන්නුම් කළේය. සංචාරක ඉපැයීම්, වෙනත් සේවා අපනයන මෙන්ම, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඉහළ යෑම මධ්‍යයේ වුව ද, මෙම අයහපත් ප්‍රවණතා හේතුවෙන් ගෙවුම් තුලනය අඛණ්ඩව දෙවැනි වසරටත් හිඟයක් වාර්තා කළේය. වසරේ පළමු සිව්මස තුළ දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ තුළ මහ බැංකුවේ ඉහළ මැදිහත්වීමක් අඛණ්ඩව පැවති අතර, එම නිසා එම කාලය තුළ විනිමය අනුපාතිකය ස්ථාවරව පැවතිණ. කෙසේ වුව ද, ඉන් පසු කාලසීමාවේ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ වෙතින් විදේශීය ආයෝජන ඉවත් කරගැනීම හේතුවෙන් විනිමය අනුපාතිකය මත ඇති වන පීඩනය මැඩපැවැත්වීම සඳහා පමණක් සිදුකරන ලද මහ බැංකුවේ මැදිහත්වීම සීමා කිරීම තුළින් විනිමය අනුපාතිකය වැඩි වශයෙන් වෙළෙඳපොළ තත්ත්වය අනුව හැඩ ගැසීමට ඉඩ සලසනු ලැබිණ.

(අ) මහ බැංකුවේ මැදිහත්වීම සීමා කිරීම නිසා ඇති වූ ප්‍රතිඵලය කුමක් ද?

............................................................................................................

............................................................................................................

............................................................................................................

(ආ) 2016 - 2017 වර්ෂවල ඉහළ උද්ධමනයක් ඇතිවීම සඳහා බලපෑවේ කවර අංශයක් ද?

............................................................................................................

............................................................................................................

............................................................................................................

(ඉ) 2016 වසරේ පළමුවන සිව්මස තුළ විනිමය අනුපාතිකය ස්ථාවරව පැවතුණේ කෙසේ ද?

............................................................................................................

............................................................................................................

............................................................................................................

(ඊ) විදේශීය අංශයෙහි විචලනයන් තුළින් පෙන්නුම් කළේ කවර කරුණු ද?

............................................................................................................

............................................................................................................

............................................................................................................

(උ) ගෙවුම් තුලනය දෙවන වසරටත් හිඟයක් වාර්තා කළේ කෙබඳු වාතාවරණයක් මධ්‍යයේ ද?

............................................................................................................

............................................................................................................

............................................................................................................

*(ලකුණු 15යි)*

(ii) මෙම පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

සමාජයේ මැදි ආදායම්ලාභී ජනතාවගේ ක්‍රයශක්තිය ඉහළ යෑමත් සමග පසුගිය වසර කිහිපය තුළ දී සමාජ යටිතල පහසුකම් සැපයුම සඳහා පෞද්ගලික අංශයේ සහභාගිත්වයේ ඇති වැදගත්කම ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇත. ක්‍රයශක්තිය ඉහළ යෑමත් සමග කාර්යක්ෂම හා ඉහළ ගුණාත්මක භාවයකින් යුතු සෞඛ්‍යය හා අධ්‍යාපනය වැනි සේවා ඉල්ලීමට පාරිභෝගිකයෝ නැඹුරු වෙත්. ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය සහ සෞඛ්‍යය වැනි සමාජීය පොදු භාණ්ඩවලින් සමාජයට ලැබෙන ප්‍රතිලාභ පෞද්ගලික ප්‍රතිලාභවලට වඩා ඉහළ මට්ටමක පවතින බැවින්, ආර්ථිකයට අවශ්‍ය ප්‍රමාණයට සාපේක්ෂව පෞද්ගලික ආයෝජන අඩු වීමට ඉඩ ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙවැනි සමාජ යටිතල පහසුකම් සැපයීමෙහි ලා රජයේ ඉහළ මැදිහත් වීමක් දක්නට ලැබේ. අඩු ආදායම්ලාභී ජනතාවට මෙම පහසුකම් ලබාගැනීමට ප්‍රමාණවත් අවකාශ ඇති බව තහවුරු කරන අතරම, ඉහළ හා මැදි ආදායම්ලාභීන්ගෙන් පවතින ඉහළ ඉල්ලුම සපුරාලීම සඳහා රජය විසින් පෞද්ගලික අංශයට ඉඩ ප්‍රස්තා සලසමින් මෙම සේවා සැපයුම් ඉහළ නැංවිය යුතුය. එබැවින්, සමාජ යටිතල පහසුකම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනික සහාය වැනි අවශ්‍ය සෙසු සම්පත් පෞද්ගලික අංශයට සපයන අතර, රජය විසින් පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ ආයතන සඳහා අදාළ වන තත්ත්ව ආරක්ෂණ මාර්ගෝපදේශ, නියාමන හා අධීක්ෂණ යාන්ත්‍රණ සහ නෛතික රාමු වැනි ආයතනික රාමු වැඩසටහන් ඇති කිරීම ද අත්‍යවශ්‍ය වේ. පෞද්ගලික ආයතන විසින් සිය ලාභ ලැබීමේ අරමුණු හා සමාජීය වගකීම් තුලනාත්මකව පවත්වා ගෙන යෑමෙන් ආර්ථිකයට වැඩි දායකත්වයක් සපයන බව තහවුරු කිරීමට මෙය අවශ්‍ය වේ.

(අ) පෞද්ගලික හා රාජ්‍ය ආයතන සඳහා රජය විසින් ආයතනික රාමු වැඩසටහන් ඇති කිරීම අවශ්‍ය වන්නේ ඇයි?

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

(ආ) පසුගිය වසර කිහිපය තුළ සමාජ යටිතල පහසුකම් සඳහා පෞද්ගලික අංශයේ සහභාගිත්වයේ ඇති වැදගත්කම ශීඝ්‍රයෙන් ඉහළ ගියේ කවර වාතාවරණයක් යටතේ ද?

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

(ඉ) සමාජ සේවා යටිතල පහසුකම් සැපයීම ඉහළ නැංවීම සඳහා රාජ්‍ය අංශයේ මැදිහත් වීමෙන් පෞද්ගලික අංශය විසින් අපේක්ෂිත ප්‍රතිලාභ මොනවා ද?

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

(ඊ) ආර්ථිකයට අවශ්‍ය ප්‍රමාණයට සාපේක්ෂව පෞද්ගලික ආයෝජන අඩු වීමට ඉඩ සැලසෙන්නේ කවර හේතුවක් නිසා ද?

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

(උ) ක්‍රයශක්තිය ඉහළ යාමත් සමග පාරිභෝගිකයන් නැඹුරු වන්නේ කවර අංශ උදෙසා ද?

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

*(ලකුණු 15යි)*

**2.** පහත දැක්වෙන පාඨය කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා ඊට යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න. සාරාංශයේ අග, ඔබ යෙදූ වචන සංඛ්‍යාව සඳහන් කරන්න.

> මූල්‍ය අංශයෙහි ශක්තිමත් භාවය සහ සුරක්ෂිත භාවය වර්ධනය කිරීම මගින් මහජනයාගේ විශ්වසනීයභාවය වැඩිදියුණු කිරීමේ අදහස පෙරදැරිව ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුළු නියාමන ආයතන විසින් මූල්‍ය ආයතන සඳහා වන අධීක්ෂණ හා නියාමන රාමුව ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගණනාවක් ආරම්භ කරන ලදි. බාසල් III සම්මුතිය යටතේ මහ බැංකුව විසින් 2017 ජූලි මස සිට බලපැවැත්වෙන පරිදි බලපත්‍රලාභී බැංකු සඳහා වන ප්‍රාග්ධන අවශ්‍යතාව ඉහළ නංවන ලදි. නියාමන ප්‍රාග්ධනය, ද්‍රවශීලතාව සහ අවදානම් කළමනාකරණය පිළිබඳ මූලික තොරතුරු ප්‍රකාශිත මූල්‍ය ප්‍රකාශ මගින් අනාවරණය කරන ලෙසත්, මුදල් පැවරීම්වලදී අයකරනු ලබන ගාස්තු පිළිබඳ වැඩි අනාවරණයක් ලබාදෙන ලෙසත්, සියලු බලපත්‍රලාභී බැංකුවලට නියම කරන ලදි. එසේම, සයිබර් ආරක්ෂණය සම්බන්ධව මතුවන්නා වූ අවදානම් සඳහා පිළියම් යෙදීමේ අරමුණින් සයිබර් ආරක්ෂණ සිද්ධි පිළිබඳ වාර්තා මහ බැංකුවට සපයන ලෙස සියලු බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දෙන ලදි. එමෙන්ම විනිවිද භාවය සහ මිල අනාවරණය ඉහළ නැංවීම මගින් බැංකු අංශය තුළ රාජ්‍ය සුරැකුම්පත් සඳහා ද්විතීයික වෙළඳපොළ ප්‍රවර්ධනයට ක්‍රියාමාර්ග ගනු ලැබීය. බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම් පිළිබඳ සැලකීමේ දී, මූල්‍ය පද්ධති ස්ථායිතාව පවත්වා ගැනීමේ අරමුණින් මූල්‍යමය වශයෙන් දුර්වල තත්ත්වයේ පසුවන මූල්‍ය ආයතන යළි නගාසිටුවීම සඳහා නියාමන ක්‍රියාමාර්ග ගන්නා අතරම දේශීය මෙන්ම විදේශීය සම්මතයන් සහ ක්‍රියාපටිපාටිවලට අනුකූලව විචක්ෂණශීලී ක්‍රියාමාර්ග ගැනීම මහ බැංකුව විසින් අඛණ්ඩව සිදුකරන ලදි.

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

*(ලකුණු 20 යි)*

[ 5 වැනි පිටුව බලන්න.

## (ආ) කොටස - සාමාන්‍ය බුද්ධිය

- අංක **1** සිට **5** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ විවිධ පදවලින්/පද යුගලවලින් යුක්ත වරණ හතරක් බැගින් දී ඇත. ඒවා අතුරින් වරණ තුනකට අයත් පද/පද යුගල පමණක් මූල්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයට අදාළව කිසියම් පාර්ශ්වයකට ගොනු කළ හැකිය. ඉතිරි වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

1. (1) අරමුණ (2) පරමාර්ථය (3) සැලැස්ම (4) ඉලක්කය (.........)

2. (1) කුවිතාන්සිය (2) බිල (3) වවුචරය (4) ඉන්වොයිසිය (.........)

3. (1) ධනය (2) දේපළ (3) වටිනාකම (4) වත්කම (.........)

4. (1) මුදල් නෝට්ටු (2) මුදල් චෙක්පත් (3) තෑගි වවුචර (4) ණයවර කාඩ්පත් (.........)

5. (1) ආධාර මුදල (2) අරමුදල (3) තෑග්ග (4) ප්‍රදානය (.........)

- අංක **6** සිට **10** තෙක් ප්‍රශ්න, පහත සඳහන් තොරතුරු මත පදනම් වේ.

දේශීය මූල්‍ය ආයතන තරා කිරීමේදී ලද ප්‍රතිඵල ඇසුරින් ධනපාල තමාට අවශ්‍ය *A, B, C, D* නම් ආයතන හතරක තොරතුරු ඇතුළත් ලේඛනයක් සකස් කළේය. මෙම ආයතන හතරම ධනපාල පදිංචි දිස්ත්‍රික්කයට අයත් ඒවා ය. දිවයිනටම අදාළ තරාවට (rank) අමතරව ධනපාල තමා පදිංචි පළාතට සහ පදිංචි දිස්ත්‍රික්කයට අදාළ තරා ද එක් එක් ආයතනය යටතේ සටහන් කළේය. ඔහුගේ ලේඛනයේ පිටපතකින් උපුටා ගත් තොරතුරු පහත වගුවෙහි සඳහන් වේ. එහි ✱, ●, @, ❖ සහ # යන සලකුණු මගින් පිටපතෙහි තිබූ අපැහැදිලි අංක නිරූපණය කර ඇත. හොඳම ආයතනයට අංක 1 හිමි වන පරිදි තරාව අංකනය කර තිබූ අතර තරා කිරීමේදී සමස්ථාන ලැබූ ආයතන නොවීය.

| ආයතනය | දිවයිනට අදාළ තරාව (Island rank) | පදිංචි පළාතට අදාළ තරාව (Provincial rank) | පදිංචි දිස්ත්‍රික්කයට අදාළ තරාව (District rank) |
|---|---|---|---|
| *A* | ✱ | 4 | ❖ |
| *B* | 15 | 3 | 2 |
| *C* | 1 | @ | # |
| *D* | ● | 20 | 7 |

ඒ අනුව, පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර අයත් වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

6. පිළිවෙළින් @ සහ # සලකුණු මගින් නිරූපිත තරා මොනවා ද?
   (1) 1, 1 (2) 1, 2 (3) 1, 3 (4) 2, 3 (.........)

7. ධනපාල පදිංචි පළාත තුළ පිහිටන, එහෙත් ඔහු පදිංචි දිස්ත්‍රික්කයේ නොවන, *B* ආයතනයට වඩා හොඳ ආයතනයක් යැයි තරා කර ඇති ආයතන සංඛ්‍යාව කීයද?
   (1) 0 (2) 1 (3) 3 (4) 12 (.........)

8. මෙහි ❖ සලකුණ මගින් නිරූපිත දිස්ත්‍රික් තරාව කුමක් ද?
   (1) 1 (2) 3 (3) 4 (4) 5 (.........)

9. දිවයිනෙහි *A* ආයතනයට වඩා හොඳ යැයි තරා කර ඇති ආයතන සංඛ්‍යාව, ධනපාල පදිංචි පළාත තුළ ඇති, *A* ආයතනයට වඩා හොඳ ආයතන යැයි තරා කර ඇති ආයතන සංඛ්‍යාව මෙන් පස්ගුණයක් නම් ✱ සලකුණ මගින් නිරූපිත තරාව කුමක් ද?
   (1) 12 (2) 13 (3) 16 (4) 20 (.........)

10. මෙහි ● සලකුණ මගින් නිරූපිත තරාව විය නොහැකි අංකය කුමක් ද?
    (1) 30 (2) 32 (3) 50 (4) 52 (.........)

[ 6 වැනි පිටුව බලන්න.

- අංක **11** සිට **15** තෙක් ප්‍රශ්න, පහත සඳහන් තොරතුරු මත පදනම් වේ.

  කාර්ය හතකින් යුත් මූල්‍ය ප්‍රගති සමාලෝචන රැස්වීමක් සඳහා ප්‍රථමයෙන් යෝජිත න්‍යාය පත්‍රය පහත සටහන මගින් නිරූපණය කෙරේ.

| කාල සීමාව | නියමිත කාර්යය |
|---|---|
| පෙ.ව 9.00 - පෙ.ව 9.05 | *A* |
| පෙ.ව 9.05 - පෙ.ව 9.15 | *B* |
| පෙ.ව 9.15 - පෙ.ව 9.30 | *C* |
| පෙ.ව 9.30 - පෙ.ව 9.50 | *D* |
| පෙ.ව 9.50 - පෙ.ව 10.00 | *E* |
| පෙ.ව 10.00 - පෙ.ව 10.25 | *F* |
| පෙ.ව 10.25 - පෙ.ව 10.30 | *G* |

කාර්යභාර නිලධාරියාගේ නිරීක්ෂණ අනුව වඩා ඵලදායි අයුරින් රැස්වීම පැවැත්වීම පිණිස මෙම යෝජිත න්‍යාය පත්‍රයෙහි කාර්ය අනුපිළිවෙළ සංශෝධනය කරන ලදී. මෙහි දී කාල සීමා පෙර පරිදි වගුවෙහි සඳහන් ආකාරයටම නොවෙනස්ව තබමින්, පහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන සංශෝධන සිදු කරන ලදී.

✻ එක් එක් කාර්යය සඳහා වෙන් කරනු ලබන කාලය, යෝජිත න්‍යාය පත්‍රයෙහි වෙන් කර තිබූ කාලයට වඩා වෙනස් විය හැකිය.

✻ ***B*** යනු ***G*** ට වඩා කෙටි කාලයකින් නිම කළ යුතු වන ***G*** ට පසු ආසන්නතම කාර්යය වේ.

✻ ***A*** සහ ***C*** යන කාර්ය දෙක අතර මෙහි සඳහන් වන කාර්ය හතරක් කළ යුතු වේ.

✻ ***C*** සඳහා ***G*** ට වඩා වැඩි කාලයක් ගත වේ.

✻ ***D*** කාර්යය නිම කළ වහාම ***F*** කාර්යය ආරම්භ කළ යුතු වේ.

මෙම තොරතුරු අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර, ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

11. අනුපිළිවෙළෙහි ස්ථානය වෙනස් නොවූ කාර්යය කුමක් ද? (………)

12. අනුපිළිවෙළ වෙනස් වුවත් වෙන් කළ කාලය වෙනස් නොවූ කාර්යය කුමක් ද? (………)

13. යෝජිත න්‍යාය පත්‍රයෙහි සඳහන් වේලාවට කලින් පැවැත්විය යුතු, එහෙත් යෝජිත න්‍යාය පත්‍රය සහ සංශෝධිත න්‍යාය පත්‍රය යන දෙකෙහිම එක ළඟ පිහිටන කාර්ය දෙක, ඒවා පැවැත්විය යුතු අනුපිළිවෙළින් ලියන්න. (………, ………)

14. යෝජිත න්‍යාය පත්‍රයෙහි වෙන් කර තිබූ මිනිත්තු ගණනට වඩා වැඩියෙන් වැඩිම මිනිත්තු ගණනක් වෙන් කිරීමට සිදුවූ කාර්යය කුමක් ද? (………)

15. සංශෝධිත න්‍යාය පත්‍රයෙහි පෙ.ව. 10.00 ට පෙර වැඩිම කාලයක් වෙන් කළ යුතු වූ කාර්යය කුමක් ද? (………)

- අංක **16** සිට **20** තෙක් ප්‍රශ්න, පහත සඳහන් තොරතුරු මත පදනම් වේ.

  සේවකයකු සඳුදා සිට සිකුරාදා තෙක් ලද මුදලින් ප්‍රවාහනය, ලිපිද්‍රව්‍ය සහ ආහාර සඳහා පමණක් වියදම් දරන ලද අතර ඊට අදාළ තොරතුරු දෝෂ සහිතව පහත සඳහන් වගුවේ සටහන් කර ඇත. දෝෂ සහිත අගය හතරක් පමණක් වගුවෙහි ඇති අතර වගුවට පසුව සඳහන් කරුණු පදනම් කරගනිමින් එම ස්ථාන හඳුනාගත හැකිය.

| දවස | ලද මුදල රු. | ප්‍රවාහන වියදම රු. | ලිපිද්‍රව්‍ය වියදම රු. | ආහාර වියදම රු. | මුළු වියදම රු. | ලද මුදලින් ඉතුරුව රු. |
|---|---|---|---|---|---|---|
| සඳුදා | 1000 | 250 | 200 | 350 | 800 | 300 |
| අඟහරුවාදා | 1200 | 350 | 250 | 400 | 1000 | 200 |
| බදාදා | 1000 | 250 | 150 | 400 | 800 | 300 |
| බ්‍රහස්පතින්දා | 1500 | 400 | 200 | 450 | 1050 | 450 |
| සිකුරාදා | 1300 | 350 | 250 | 350 | 850 | 450 |
| එකතුව | 6100 | 1600 | 950 | 1950 | 4500 | 1700 |

වගුවෙහි,

බදාදාට අදාළ එක් අගයක් පමණක් වැරදි ය.

'ලද මුදල' තීරයේ සඳහන් එක් රු. 1000 ක් පමණක් නිවැරදි කළ යුතු ය.

සඳුදා 'මුළු වියදම' සහ 'ඉතුරුව' නිවැරදි ය.

'ලිපිද්‍රව්‍ය වියදම' තීරයේ සහ 'එකතුව' පේළියේ එක් අගය බැගින් පමණක් වැරදි ය.

ඒ අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර අයත් වරණයෙහි අංකය, ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

16. බදාදාට අදාළව වැරදි අගයක් සඳහන් වන්නේ කුමන තීරුවේ ද?
(1) ලද මුදල (2) ප්‍රවාහන වියදම (3) මුළු වියදම (4) ලද මුදලින් ඉතුරුව (.........)

17. 'ලද මුදල' තීරයේ ඇති වරද කුමක් ද?
(1) එකතුව රු. 6100 ලෙස සඳහන් වීම
(2) සඳුදා ලද මුදල රු. 900 ලෙස සඳහන් නොවීම
(3) සඳුදා ලද මුදල රු. 1100 ලෙස සඳහන් නොවීම
(4) බදාදා ලද මුදල රු. 1100 ලෙස සඳහන් නොවීම (.........)

18. 'ලිපිද්‍රව්‍ය වියදම' තීරයේ වරද නිවැරදි කළ හැකි ආකාරය කුමක් ද?
(1) සඳුදාට අදාළ මුදල රු. 100 ලෙස සංශෝධනය කිරීම
(2) බදාදාට අදාළ මුදල රු. 50 ලෙස සංශෝධනය කිරීම
(3) සිකුරාදාට අදාළ මුදල රු. 150 ලෙස සංශෝධනය කිරීම
(4) 'එකතුව' පේළියේ සඳහන් මුදල රු. 1050 ලෙස සංශෝධනය කිරීම (.........)

19. දින පහ අවසනදී 'ලද මුදලින් ඉතුරුව' කොපමණ ද?
(1) රු. 1700 (2) රු. 1600 (3) රු. 1550 (4) රු. 1500 (.........)

20. බ්‍රහස්පතින්දා ආහාර වියදම රු. 500 ක් විණි නම්, එය ඉහත නිවැරදි කළ වගුවට ඇතුළත් කර යළි වගුව නිවැරදිව සැකසීම පිණිස තවත් අගය කීයක් සංශෝධනය කිරීමට සිදු වේ ද?
(1) 3 යි. (2) 4 යි. (3) 5 යි. (4) 6 යි. (.........)

- අංක **21** සිට **25** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර අයත් වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

21. කිසියම් භාණ්ඩයක් 10% ක වට්ටමක් සහිතව මිල දී ගැනීමේදී ලැබුණු වට්ටම් මුදල මෙන් හතර ගුණයක වට්ටම් මුදලක්, එමෙන් දෙගුණයක් මිලැති භාණ්ඩයක් මිල දී ගැනීමේදී ලැබුණේ නම්, එම දෙවැනි භාණ්ඩය මිල දී ගැනීමේදී කොපමණ වට්ටමක් ලැබුණේ ද?
(1) 5% (2) 10% (3) 20% (4) 40% (.........)

22. තම මුදල් පසුම්බියෙහි වූ රු. 1000 නෝට්ටු සියල්ල එක් කවරයකට එක බැගින් දැමීමට යාමේදී එක් කවරයක් අඩු බව දයාවතීට වැටහුණි. අනතුරුව ඇය කවරයකට රු. 1000 නෝට්ටු දෙක බැගින් දැමීමේදී කවරයක් ඉතුරු විය. දයාවතීගේ පසුම්බියෙහි රු. 1000 නෝට්ටු ලෙස රුපියල් කීයක මුදලක් තිබුණිද යන්නත් කවර කීයක් තිබුණිද යන්නත් පිළිවෙළින් සඳහන් වන පිළිතුර කුමක් ද?
(1) 3, 4 (2) 4, 3 (3) 3, 4 000 (4) 4 000, 3 (.........)

23. නියත සීඝ්‍රතාවෙන් නමුත් දෝෂ සහිතව ක්‍රියා කරන *A* හා *B* නමැති ඔරලෝසු දෙකක වේලාව එකම මොහොතේ 12.00 ලෙස සකස් කර ක්‍රියාත්මක කරන ලදී. *A* හි පළමුවරට 1.00 ලෙස වේලාව දර්ශනය වන විට *B* හි පළමුවරට 1.15 ලෙස වේලාව දර්ශනය විය. *B* හි පළමුවරට 2.00 ලෙස වේලාව දර්ශනය වන විට *A* හි දර්ශනය වූ වේලාව කුමක් ද?
(1) 1.36 (2) 1.48 (3) 2.12 (4) 2.24 (.........)

24. එක්තරා ලියවිල්ලක රු. 10 ක වටිනාකමට සමාන වන සේ මුද්දර ඇලවිය යුතුව ඇත. මේ සඳහා රු. 1, රු. 2, රු. 5 සහ රු. 10 මුද්දර පමණක් භාවිත කළ හැකි නම් එකිනෙකට වෙනස් කී ආකාරයකට මුද්දර තෝරා ගත හැකි ද?

(1) 8 (2) 9 (3) 10 (4) 11 (.........)

25. පුද්ගලයකුගේ එකම අක්කා කමලා ය; එකම නැගණිය ගීතා ය; එකම මල්ලී රාජු ය; එකම අයියා සිරිපාල ය. මින් හතරදෙනකුගේ ම නැගණිය වන ගීතා සෑමවිටම බොරු කියන්නියකි. ඇයට සොහොයුරන් තිදෙනකු සහ සොහොයුරියක සිටින බව ඇය කියයි. මෙම තොරතුරු අනුව පහත ප්‍රකාශවලින් නිවැරදි කුමක් ද?

(1) සිරිපාලට සොහොයුරෝ සහ සොහොයුරියෝ සම සමව සිටිති.

(2) කමලාට නැගණියෝ දෙදෙනෙක් සිටිති.

(3) රාජුට වැඩිමහල් සොහොයුරෝ දෙදෙනෙක් සිටිති.

(4) ගීතාට සිටින සොහොයුරියන් ගණන 1 කි. (.........)

- අංක **26** සිට **30** තෙක් ප්‍රශ්න, පහත සඳහන් තොරතුරු මත පදනම් වේ.

1 සිට 7 තෙක් අංක ලබා දී ඇති සේවක සේවිකාවන් හත්දෙනකු අතුරින් අංක 2, අංක 4 සහ අංක 6 පමණක් කාන්තාවෝ වෙති. කිසියම් කාර්යයක් සතියක දින පහ තුළ නිම කිරීමට ඔවුනට පැවරී ඇති ආකාරය පහත සඳහන් කර ඇත.

* කාර්යය, සඳුදා ආරම්භ කර සිකුරාදා නිම කළ යුතුය. දිනකට තිදෙනකු බැගින් වැඩ කළ යුතුය.

* අංක 1 සඳුදා වැඩ නොකළ යුතුය. එහෙත් අංක 2 සඳුදා වැඩ කළ යුතුය.

* සෑම අයකු සඳහා ම වැඩ කරන දිනට පසුදින නිවාඩු දිනයකි.

* අංක 3 පමණක් දින 3 ක් වැඩකළ යුතු අතර සෙසු සැවොම දින 2 බැගින් වැඩ කළ යුතුය.

* බදාදා කාන්තාවන්ගෙන් අංක 2 සහ 4 යන දෙදෙනා පමණක් ද අන් සෑම දිනකම එක් කාන්තාවක් බැගින් ද වැඩ කළ යුතුය.

* අංක 6 හා 7 සෑම විටම එකට වැඩ කළ යුතුය.

* ආරම්භක දිනයත් අවසාන දිනයත් යන දින දෙකෙහි ම වැඩ කිරීමට මේ අතුරින් දෙදෙනකුට පමණක් අවස්ථාව දිය යුතුය.

ඒ අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර අයත් වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

26. අංක 3 වැඩ නොකළ යුතු දවස් දෙක මොනවා ද?

(1) සඳුදා, බදාදා (2) අඟහරුවාදා, බ්‍රහස්පතින්දා

(3) අඟහරුවාදා, සිකුරාදා (4) බ්‍රහස්පතින්දා, සිකුරාදා (.........)

27. අංක 4 වැඩ කළ යුතු දවසක් වන්නේ පහත දැක්වෙන දවස් අතුරෙන් කවදා ද?

(1) සඳුදා (2) අඟහරුවාදා (3) බ්‍රහස්පතින්දා (4) සිකුරාදා (.........)

28. අංක 6 වැඩ කළ යුතු දවස් දෙක මොනවා ද?

(1) අඟහරුවාදා, බ්‍රහස්පතින්දා (2) අඟහරුවාදා, සිකුරාදා

(3) සඳුදා, බදාදා (4) බදාදා, සිකුරාදා (.........)

29. සිකුරාදා වැඩ කළ යුතු තිදෙනා කවුද?

(1) අංක 1, 3 හා 4 (2) අංක 2, 3 හා 4

(3) අංක 3, 4 හා 5 (4) අංක 4, 5 හා 7 (.........)

30. එකම කණ්ඩායම වැඩ කළ යුතු වන දවස් දෙක මොනවා ද?

(1) සඳුදා, බදාදා (2) අඟහරුවාදා, බ්‍රහස්පතින්දා

(3) අඟහරුවාදා, සිකුරාදා (4) බදාදා, සිකුරාදා (.........)

● අංක 31 සිට 35 තෙක් ප්‍රශ්න, පහත සඳහන් තොරතුරු මත පදනම් වේ.

$V_1$, $V_2$, $V_3$, $V_4$ හා $V_5$ යන වැය ශීර්ෂ පහ යටතේ ආයතනයකට ලැබී ඇති මූල්‍ය ප්‍රතිපාදන අනුපිළිවෙළින් තොරව රු. මිලියන 20, රු. මිලියන 30, රු. මිලියන 150, රු. මිලියන 750 සහ රු. බිලියන 2 වේ. $V_1$ වැය ශීර්ෂය යටතේ ලද ප්‍රතිපාදන මුදල $V_5$ වැය ශීර්ෂය යටතේ ලද ප්‍රතිපාදන මුදලින් 20% කට සම වේ. $V_2$ සහ $V_4$ වැය ශීර්ෂ යටතේ ලද මුළු ප්‍රතිපාදන මුදලින් 60% ක් ම $V_2$ වැය ශීර්ෂය යටතේ ලැබුණි. ***A, B, C, D, E, F, G*** හා ***H*** යන වැඩසටහන් මෙම වැය ශීර්ෂ යටතේ පහත සඳහන් පරිදි ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ය.

* ***A*** හා ***D*** ක්‍රියාත්මක කළ යුත්තේ එකම වැය ශීර්ෂයක් යටතේ වේ.
* ***E, F, G*** හා ***H*** එකිනෙකට වෙනස් වැය ශීර්ෂ යටතේ ක්‍රියාත්මක කළ යුතු වේ.
* මින් එක් වැය ශීර්ෂයක් යටතේ ඉහත සඳහන් වැඩ සටහන් අටෙන් කිසිවක් ක්‍රියාත්මක කළ නොහැකි ය.
* ***H*** ඇතුළුව වැඩිම වැඩසටහන් ගණනක් ක්‍රියාත්මක කළ යුත්තේ මින් අඩුම ප්‍රතිපාදන මුදල වෙන් වූ වැය ශීර්ෂය යටතේ පමණි.
* ***G*** හා ***B*** වැඩසටහන් සඳහා එකකට අවම වශයෙන් රු. මිලියන 800 ක් බැගින් අවශ්‍ය වේ.
* රු. මිලියන 150 ක ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වන්නේ මින් එක් වැඩසටහනක් පමණි.
* ***E*** වැඩසටහන $V_1$ යටතේ හෝ $V_2$ යටතේ හෝ ක්‍රියාත්මක කළ නොහැකි වේ.

ඒ අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර අයත් වරණයෙහි අංකය, ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

31. ***A*** හා ***D*** යන වැඩසටහන් ක්‍රියාත්මක කළ යුත්තේ කුමන වැය ශීර්ෂය යටතේ ද?
(1) $V_1$ (2) $V_2$
(3) $V_3$ (4) $V_4$ (………)

32. ***E*** වැඩසටහන ක්‍රියාත්මක කළ යුතු වැය ශීර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදන මුදල කොපමණ ද?
(1) රු. මිලියන 20 යි. (2) රු. මිලියන 150 යි.
(3) රු. මිලියන 750 යි. (4) රු. බිලියන 2 යි. (………)


33. රු. මිලියන 150 ක් වෙන් වූ වැය ශීර්ෂය යටතේ ක්‍රියාත්මක කළ යුතු වැඩසටහන කුමක් ද?
(1) ***E*** (2) ***F***
(3) ***G*** (4) ***H*** (………)

34. මින් කිසිදු වැඩසටහනක් ක්‍රියාත්මක කළ නොහැකි වැය ශීර්ෂය කුමක් ද?
(1) $V_1$ (2) $V_2$
(3) $V_3$ (4) $V_4$ (………)

35. සපයා ඇති තොරතුරුවලට අනුව, ***C*** වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ හැක්කේ කුමන වැය ශීර්ෂය/ශීර්ෂ යටතේ ද?
(1) $V_3$ පමණි. (2) $V_4$ පමණි.
(3) $V_5$ පමණි. (4) $V_4$ හෝ $V_5$ (………)


[ 10 වැනි පිටුව බලන්න.

● අංක **36** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ රූපසටහන් හතරක් බැගින් දී ඇත. ඉන් රූපසටහන් තුනක් එකිනෙක සම්බන්ධ කිරීමෙන්, පහත ඇති විශාල රූපසටහනෙහි කිසියම් කොටසක් හා සමාන රූපයක් තනා ගත හැකිය. මෙහිදී රූපසටහන් අවශ්‍ය පරිදි භ්‍රමණය කිරීමට අවසර ඇත.




එසේ, විශාල රූප සටහනෙහි කිසියම් කොටසකට සමාන රූපයක් තනා ගැනීමට, එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති රූප අතුරින් අවශ්‍ය නොවන රූපය තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

36.


(1)



(2)


(3)



(4)

(.........)

37.


(1)



(2)


(3)



(4)

(.........)

38.


(1)


(2)



(3)


(4)


(.........)

39.


(1)


(2)


(3)



(4)

(.........)

40.


(1)


(2)


(3)


(4)

(.........)

- අංක **41** සිට **45** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ ප්‍රකාශ හතර බැගින් දී ඇත. ඉන් ප්‍රකාශ තුනක්, එක්තරා කරුණක් සම්බන්ධයෙන් එකිනෙක සංගත වේ. ඉතුරු ප්‍රකාශය ද අසත්‍ය නොවූවත්, එය දී ඇති අනෙක් ප්‍රකාශ දෙකක් සමග සංගත වන බවට සාක්ෂි නොමැත.

  එසේ සංගත නොවන ප්‍රකාශය තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

41. (1) විභාගය අඟහරුවාදා පැවැත්වේ.
    (2) බ්‍රහස්පතින්දා පෝය දිනය වේ.
    (3) විභාගය විසිහත්වන දා පැවැත්වේ.
    (4) පෝය දිනය, විභාගයට දිනකට පසු දිනය වේ. (.........)


42. (1) මිල අධිකම බිස්කට් සුනිල් ද මිල අඩුම බිස්කට් කමලා ද ගෙනවිත් තිබුණි.
    (2) නිමල් ගෙන ආ බිස්කට් එතරම් මිල නොවූව ද නවතම රසයකින් යුක්ත ය.
    (3) සුනිල් ගෙන ආ බිස්කට්, නිමල් ගෙන ආ රසවත්ම බිස්කට් තරම් රසවත් නොවූව ද ඊට වඩා මිලෙන් වැඩි ය.
    (4) නිමල් ගෙන ආ බිස්කට්, කමලා ගෙන ආ බිස්කට්වලට වඩා මිලෙන් ද රසින් ද වැඩිය. (.........)

43. (1) ***A, B, C*** හා ***E*** යන සංඛ්‍යා හතරෙහි ආරෝහණ පිළිවෙළ ***B, C, A, E*** වේ.
    (2) ***A, C, D*** හා ***E*** යන සංඛ්‍යා හතරෙහි අවරෝහණ පිළිවෙළ ***D, E, A, C*** වේ.
    (3) ***A, B, C*** හා ***D*** යන සංඛ්‍යා හතරෙහි ආරෝහණ පිළිවෙළ ***B, C, A, D*** වේ.
    (4) ***B, C, E*** හා ***F*** යන සංඛ්‍යා හතරෙහි අවරෝහණ පිළිවෙළ ***E, C, B, F*** වේ. (.........)


44. (1) පිළිවෙළින් දේවි, මාලා සහ රම්‍යා යනු රාජුගේ පොඩි අක්කා, මද්දුම අක්කා සහ ලොකු අක්කා වන අතර ඩේවිඩ්, රාජුගේ අයියා වේ.
    (2) පිළිවෙළින් මාලා හා රම්‍යා, දේවිගේ පොඩි අක්කා හා ලොකු අක්කා වන අතර ඩේවිඩ් ඇයගේ අයියා ද රාජු ඇයගේ මල්ලී ද වේ.
    (3) රම්‍යා, ඩේවිඩ්ගේ අක්කා වන අතර මාලා හා දේවි යනු ඔහුගේ නැගණියන් ද රාජු යනු මල්ලී ද වේ.
    (4) රම්‍යා හා ඩේවිඩ්, මාලාට වැඩිමහල් වන අතර ඇයට පසුව දේවිත් ඊටත් පසුව රාජුත් ඉපිද තිබේ. (.........)

45. (1) ආයතනයකට පත්වීම ලද එකම මාණ්ඩලික නිලධාරියා අවසානයට ම පත්වීම ලද ලාබාලතම කාන්තාව වේ.
    (2) ආයතනයක මාණ්ඩලික නිලධාරි තනතුරකට අවසානයට පත් වූ පුද්ගලයා හැර එහි සෙසු සියලු මාණ්ඩලික නිලධාරීහු පිරිමි වෙති.
    (3) ආයතනයක සේවය කරන කාන්තා මාණ්ඩලික නිලධාරිනියට වඩා එහි සේවය කරන පිරිමි නිලධාරීහු සියලුදෙනා වයසින් වැඩි වූවෝ වෙති.
    (4) ආයතනයක මාණ්ඩලික තනතුරක් දරන නවතම හා ලාබාලතම පුද්ගලයා දැනට එහි සේවය කරන එකම මාණ්ඩලික නිලධාරිනිය වේ. (.........)


- අංක **46** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ රූප පේළියක් බැගින් දී ඇත. ඒවා වමේ සිට දකුණට කිසියම් රටාවකට පෙළගස්වා ඇත. මෙම රූප පේළියෙහි **?** සලකුණ සහිත ස්ථානයට ගැළපෙන රූපය දී ඇති වරණ අතුරින් තෝරා, ඊට අදාළ අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

46. 

(1) (2) (3) (4) (.........)

47. 

(1) (2) (3) (4) (.........)

48. 

(1) (2) (3) (4) (.........)

49. | 1.1 | 1.21 | 1.331 | 1.4641 | ? |

| (1) | (2) | (3) | (4) |
|---|---|---|---|
| 1.61051 | 16.1051 | 1.60151 | 1.16051 |

(.........)

50. 2  12  36  80  150  ?

| (1) | (2) | (3) | (4) |
|---|---|---|---|
| 196 | 212 | 216 | 252 |

(.........)

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ
සීමිත / විවෘත තරග විභාගය – 2016 (2018)

**(06) රාජ්‍ය මූල්‍ය කළමනාකරණය**

පැ තුනයි

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

**1.** "රාජ්‍ය මූල්‍යය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු වේ. වාර්ෂික අයවැයෙහි දක්වා ඇති කාර්යයන් වෙනුවෙන් ඒකාබද්ධ අරමුදලෙන් වියදම් දැරීමට බලය ලැබෙන්නේ විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවෙන් සම්මත වී පනතක් (විසර්ජන පනතක්, Appropriation Act) බවට පත්ව මුදල් ඇමතිතුමා විසින් වොරන්ට් බලපත්‍රයක් නිකුත් කිරීමෙන් පසුව ය."

(i) "ඒකාබද්ධ අරමුදල" කෙටියෙන් පැහැදිලි කරන්න.

(ii) කිසියම් අවස්ථාවක ඒකාබද්ධ අරමුදලේ පවතින ශේෂය නිශ්චය කරනුයේ කෙසේ ද?

(iii) විසර්ජන පනතට අනුව "උපරිම ණය ගැනීම් සීමාව" යනු කුමක් ද?
එය ගණනය කරනු ලබන්නේ කෙසේ ද?

(iv) වාර්ෂික අයවැය කාර්යයන් සම්බන්ධයෙන් රජයේ ණය ගැනීමේ ක්‍රියාවලිය මෙහෙයවීම සඳහා සම්බන්ධ වන ආයතන දෙක මොනවා ද?

*(ලකුණු 05 × 4 = 20 යි)*

**2.** (i) මු.රෙ. 103 (1) අනුව රජයේ දේපළක් නැතිවූ විට හෝ කිසියම් දේපළකට අලාභ හානිවීමක් සිදු වූ කල ඒ සම්බන්ධයෙන් ගතයුතු පියවර කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 10 යි)*

(ii) කිසියම් ගනුදෙනුවකට අදාළ ගෙවීම් වවුචරයක් සහතික කිරීමේදී ගණකාධිකාරිවරයකු සැලකිලිමත් විය යුතු කරුණු මු.රෙ. 138 අනුව පැහැදිලි කරන්න. *(ලකුණු 10 යි)*

**3.** (i) වාර්ෂික අයවැයෙහි ඇතුළත් රජයේ වියදම්, පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් ලෙස ප්‍රධාන කොටස් දෙකකට බෙදේ. මේ එකිනෙක කොටසෙහි ඇතුළත් ප්‍රධාන වියදම් කාණ්ඩ කවරේ ද? එයින් පහක් කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 10 යි)*

(ii) රාජ්‍ය අයවැය ක්‍රියාත්මක කිරීමෙහි ලා සම්බන්ධ වන විවිධ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු පහක් නම් කරන්න. *(ලකුණු 05 යි)*

(iii) ඔබ ඉහත නම් කළ දෙපාර්තමේන්තු දෙකක කාර්යභාරය සැකෙවින් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

**4.** (i) දෙපාර්තමේන්තු පොත් (ගිණුම්), භාණ්ඩාගාර පොත් (ගිණුම්) සමග මාසිකව සැසඳීමේ වැදගත්කම පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

(ii) ගිණුම් වර්ෂයක් අවසානයේදී "අග්‍රිම ශේෂය පියවීම" (Settlement of imprest balance) යනුවෙන් අදහස් කෙරෙන්නේ කුමක් ද? *(ලකුණු 05 යි)*

(iii) රාජ්‍ය මූල්‍යය පාලනය සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ කාර්යභාරය පැහැදිලි කරන්න. *(ලකුණු 10 යි)*

**5.** (i) "රාජ්‍ය ප්‍රසම්පාදනය (ටෙන්ඩර් කටයුතු) රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලියේ ඉතා වැදගත් අංගයකි." රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රධාන මූලධර්ම පදනම් කරගෙන මෙම ප්‍රකාශය විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

(ii) පහත සඳහන් පද යුගල අතර වෙනස සංක්ෂිප්තව පැහැදිලි කරන්න.

(a) ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හා ගණන්දීමේ නිලධාරියා *(ලකුණු 05 යි)*

(b) වගකීම (Responsibility) හා වගවීම (Accountability) *(ලකුණු 05 යි)*

* * *